ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

වාර්ෂික වාර්තාව 2022

සිංහල

පටුන

1. ආයතනික තොරතුරු
2. දැක්ම, මෙහෙවර සහ අරමුණු
3. වැදගත් සංධිස්ථාන
4. ප්‍රධාන කාර්ය සාධන සාරාංශය
5. සභාපතිතුමාගේ පණිවුඩය
6. අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය
7. අධ්‍යක්ෂ මණ්ඩලය - 2022
8. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව
9. ආයතන ව්‍යූහය සහ කාර්ය මණ්ඩල තොරතුරු
10. මෙහෙයුම් ප්‍රගතිය
    - අධ්‍යාපන හා පරීක්ෂණ අංශය
    - උත්තේජක ගැනීම් තහවුරු වූ හා නීතිමය කටයුතු අංශය
    - බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම් අංශය
    - පර්යේෂණ අංශය
11. තිරසාරභාවය පිළිබඳ වාර්තාව
12. ආයතනික පාලනය
13. අවදානම් කළමනාකරණ වාර්තාව
14. විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව
15. මූල්‍ය වාර්තා
16. ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව
17. විගණන වාර්තාව 2022 සහ කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

වර්තමානයේ ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් වාණිජකරණය වී තිබේ. ඒ හේතුවෙන් වර්තමාන ක්‍රීඩක ක්‍රීඩිකාවන් හුදෙක් ම ජයග්‍රහණය අරමුණ කොටගෙන ක්‍රීඩා කිරීමට යොමු වී තිබේ. මෙහිදී පවතින දැඩි තරගකාරීත්වය නිසාම නීත්‍යානුකූල නොවන ක්‍රමවේද භාවිත කර හුදු ජයග්‍රහණ ලබා ගැනීමට ඔවුන් පෙළඹී තිබේ.

මේ හේතුවෙන් ක්‍රීඩාවේ දී තහනම් ද්‍රව්‍ය හා ක්‍රම කරලියට පැමිණ තිබේ. ජාතික මෙන් ම ජාත්‍යන්තර ක්‍රීඩා තරගවල දී මෙම තහනම් ද්‍රව්‍ය භාවිතය තුළින් ක්‍රීඩාවේ අව්‍යාජ භාවයට හානි සිදුකරනවා සේ ම අවසානයේ රටක් ලෙස ජාත්‍යන්තරය ඉදිරියේ අපකීර්තියට පත් ව ජව සම්පන්න රටේ මතු පරපුර සෞඛ්‍ය අතින් පරිහානියට ද පත් වේ.

ජාත්‍යන්තර මට්ටමෙන් තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා 1999 සිට කැනඩාවේ මොන්ට්‍රියෙල් නුවර කේන්ද්‍ර කොටගෙන ක්‍රියාත්මක වන ලෝක තහනම් උත්තේජක මර්දන ආයතනය අනුගමනය කරමින් 2013 වසර තෙක් ම ශ්‍රී ලාංකික ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ ඒ පිළිබඳ ව නිරූපණය කිරීම් සිදු කිරීම ක්‍රීඩා වෛද්‍ය ආයතනය මගින් සිදුවිය.

මෙම විෂය ඉටුකිරීම සඳහා ස්වාධීන කටයුතු කරන වෙනම ම ආයතනයක අවශ්‍යතාවය ඒ වන විටත් මතුවෙමින් තිබුණ බැවින් 2013 වර්ෂයේ නොවැම්බර් 10 වැනි දින දී "2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත" සංස්ථාපනය කෙරුණි. එම පනතෙහි තුන්වන කොටස යටතේ තහනම් ද්‍රව්‍ය හා ක්‍රම ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවෙන් මුලිනුපුටා දැමීම වන විෂය තේමා කර ගත් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නමින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බිහි කරනු ලැබීය.

දැනට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ක්‍රීඩා හා කටයුතු යෞවන අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස කටයුතු කරයි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩාවේ දී භාවිතා නොකළ යුතු තහනම් උත්තේජක මුලිනුපුටා දැමීම හා යහපත් පිරිසිදු භාවයෙන් යුතු ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීමයි.

ආයතනික තොරතුරු

ආයතනයේ නම

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

නෛතික ස්වරූපය

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ තුන්වන කොටස යටතේ මෙම ආයතනය පිහිටුවා ඇත.

ආරම්භක දිනය

2013 වර්ෂයේ නොවැම්බර් 10 වැනි දින

කාර්යාලයේ ලියාපදිංචි ලිපිනය

363/12, සුගතදාස ස්ටේඩියම්-බ්ලෝක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.

දූරකථන අංක

0113 071 838
011-2328366

විද්‍යුත් තැපෑල

sladasl@yahoo.com

වෙබ් අඩවිය

www.antidopingsrilanka.org

බදු හඳුනා ගැනීමේ අංකය

409386822

විගණක

විගණකාධිපති

බැංකුකරුවන්


ලංකා බැංකුව

දැක්ම

නිවැරදි හා සාධාරණ ජයග්‍රහණයක්
උදෙසා තහනම් ද්‍රව්‍යවලින් තොර
ශ්‍රී ලාංකීය ක්‍රීඩා ජවයක්

මෙහෙවර

ලෝක මත්ද්‍රව්‍ය නිවාරණ පනත සහ
එහි රෙගුලාසිවලට අනුකූල වන
ආකාරයට **2013** අංක **33** දරන ක්‍රීඩාවල
යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට
එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීම



අරමුණු

<u>මූලික අරමුණ</u>

ශ්‍රී ලංකාවේ ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තියට අනුකූල ව කටයුතු කිරීමට සහය දැක්වීම.

<u>ද්විතීයික අරමුණු</u>

- ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් රජයට,ක්‍රීඩා අමාත්‍යාංශයට සහ ජාතික ඔලිම්පික් කමිටුව දැනුවත් කිරීම.
- 2021 ලෝක තහනම් උත්තේජක මර්දන නීති සංග්‍රහය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් ශ්‍රී ලංකාව පුරා ක්‍රියාවට නැංවීම ප්‍රමුඛ වීම.
- ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තියට අනුකූල වීම සඳහා සියලු ම ක්‍රීඩා සංගම්/ ආයතනවලට සහයෝගය ලබා දීම.
- වාණිජමය පදනමින් අදාළ වන ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි කලාපීය තහනම් උත්තේජක මර්දන ආයතන ඇතුළු ව අනෙකුත් තහනම් උත්තේජක මර්දන ආයතන සමඟ යාවත්කාලීන වූ තහනම් උත්තේජක මර්දන භාවිතයන් සහ විශේෂඥ දැනුම බෙදා ගැනීම.
- WADA සහ iNADO ඇතුළු බලගතු තහනම් උත්තේජක මර්දන ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- ජාතික වැදගත්කමක් ඇති ඉහළ මට්ටමේ ක්‍රීඩා ඉසව් සඳහා විශේෂඥ තහනම් උත්තේජක මර්දනය සම්බන්ධ උපදෙස් සහ මග පෙන්වීම් ලබා දීම.
- සියලු ම ප්‍රධාන ඉසව් සම්බන්ධ වගකීම් ලෝක මට්ටමේ ප්‍රමිතියට අනුව ඉටු කිරීම.
- තහනම් උත්තේජක භාවිතය වැළැක්වීම සඳහා අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ වැඩසටහනක් ලබා දීම.
- අභ්‍යන්තර හා බාහිර ව විශේෂඥයන් යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතයේ අවදානම අඛණ්ඩව ඇගයීමට ලක් කිරීම.
- නීතිය බලාත්මක කිරීම ඇතුළු ව පවතින කඳවුරු තුළින් බුද්ධි තොරතුරු රැස් කිරීම පිළිබඳ නිපුණතා වැඩි කිරීම.
- ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ අධ්‍යාපනික දර්ශනය හරහා අධ්‍යාපන වැඩසටහන් හරහා වැළැක්වීම මත පදනම් වූ සාරධර්ම ශක්තිමත් කිරීම, ඉතා සුදුසු ප්‍රායෝගික මෙවලම් සහ උපකාරක සේවා වර්ධනය මගින් සහාය වීම.
- බුද්ධි තොරතුරු ප්‍රමුඛ, ජවසම්පන්න සහ ප්‍රතිග්‍රාහක පරීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- තහනම් උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීම දැඩි ලෙස විමර්ශනය කර නඩු පැවරීම.
- ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහ භාවිතයන් යොදා ගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ඒකාකාර ක්‍රීඩා පිටියක් ප්‍රවර්ධනය කිරීම.

SLADA Key Milestones

2013 Established under the Act



PARLIAMENT OF THE DEMOCRATIC
SOCIALIST REPUBLIC OF
SRI LANKA

CONVENTION AGAINST DOPING IN
SPORT ACT, No. 33 OF 2013

slantidoping.org/slada_code.html

2018 Hosted the 15th Asia/Oceania Intergovernmental Ministerial Meeting in Colombo



2019 Opened new SLADA Headquarters building in Colombo



slantidoping.org/history.html

2021 Opened the new Research Laboratory at SLADA



slantidoping.org/lab_opening2021.html

ප්‍රධාන කාර්ය සාධන සාරාංශය

විස්තරය	ගණන	2018	2019	2020	2021	2022
තහනම් උත්තේජක පරීක්ෂණ සිදුකිරීම	ගණන	276	260	106	177	138
උත්තේජක ලබාගැනීම් තහවුරු වීම්	ගණන	10	06	02	04	05
විනය පරීක්ෂණ පැවැත්වීම	ගණන	06	06	08	02	09
අභියාචනා පරීක්ෂණ පැවැත්වීම	ගණන	-	03	-	04	07
ක්‍රීඩකයන් හා ඊට අදාළ පුද්ගලයින් දැනුවත් කිරීම	වැඩසටහන්	67	46	28	35	48
දැනුවත් කිරීම් වැඩසටහන්වලට සහභාගී වූ පුද්ගලයින්	පුද්ගලයින්	2114	3357	965	1600	2316
පර්යේෂණ Abstract වාර්තා ප්‍රකාශනය	ගණන	03	00	01	00	02
මුළු පර්යේෂණ වාර්තා ප්‍රකාශනය	ගණන	00	00	00	02	01
මෘදුකාංග සංවර්ධනය (ජංගම සහ වෙබ්)	ගණන	01	01	01	00	00
මුළු කාර්ය මණ්ඩලය	පුද්ගලයින්	23/27	23/27	22/28	23/29	19/29
වැටුප් හා වේතන	රු.මි.	13.1	13.4	13.4	15.5	16.7
ආදායම	රු.මි.	0.42	0.72	2.93	1.85	2.23
දේපළ පිරියත උපකරණ	රු.මි.	194	273	286	270	260
ජංගම වත්කම්	රු.මි.	2.3	4.9	4.6	7.4	5.3
ජංගම වගකීම්	රු.මි.	9.4	8.2	15.3	16.0	15.2

සභාපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය 2022 වර්ෂය සඳහා විශිෂ්ට කාර්යසාධනයක් පෙන්නුම් කරයි. විශේෂයෙන්ම වසර කිහිපයක්ම පැවති COVID 19 වසංගත තත්වයේ ක්‍රමික අඩු වීමත් සමඟ නව උද්යෝගයකින් යුතුව ස්වකීය මෙහෙවර පවත්වාගෙන යාමට ආයතනයට අවස්ථාව හිමි වුණි.

ශ්‍රී ලංකාව තුළ පිරිසිදු ක්‍රීඩා ජවය නඟා සිටුවීම මෙන් ම තහනම් උත්තේජක සම්බන්ධ අන්තර්ජාතික ප්‍රවණතාවලට දිනෙන් දින අනුගත වෙමින් යාවත්කාලීනව ක්‍රියාත්මක වීමට අප ආයතනය ඉතා වගකීමෙන් බැඳී කටයුතු කරයි. එමගින් රටේ දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට, අන්තර්ජාතික තලයේ තරඟාවලි සඳහා සහභාගී වීමේ අවකාශය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නිරන්තරයෙන් සාක්ෂාත් කරනු ලබයි.

2022 වසරේ පැවති අභියෝගකාරී ආර්ථික පසුබිම තුළ වුවද පැවති සීමිත මූල්‍ය සම්පත් උපයෝගි කරගෙන තහනම් උත්තේජක සම්බන්ධ පරීක්ෂණ සිදුකර තහනම් උත්තේජක ලබා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 8 දෙනෙකු හඳුනා ගැනීමට ආයතනය සමත් වී තිබේ. අදාළ ක්‍රීඩකයන්ට එරෙහිව නෛතික පියවර ගන්නා ලද අතර ඒ තුළින් සමස්ත ක්‍රීඩාවට සිදුවන හානිය අවම කිරීමට දැනුවත් කිරීමේ අධ්‍යාපන වැඩසටහන් සංවිධානය ද අඛණ්ඩව සිදු කරන ලදි.

තවද තහනම් උත්තේජක සම්බන්ධ නීති තත්වය පිළිබඳ පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද දීප ව්‍යාප්ත වශයෙන් සංවිධානය කරන ලදි. එසේම 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත උපයෝගී කරගනිමින් තහනම් උත්තේජක ගෙන්වන සහ බෙදාහරින පුද්ගලයන්ට එරෙහිව නෛතික පියවර ගැනීමට අපේක්ෂා කරයි. මෙහි මූලික අරමුණ වනුයේ රට තුළට තහනම් උත්තේජක ඇතුළුවන මූලාශ්‍ර අවහිර කිරීම තුළින් පිරිසිදු සහ අව්‍යාජ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීමයි.

විශේෂයෙන් ම ක්‍රීඩා වෛද්‍ය නිලධාරීන් සඳහා තහනම් උත්තේජක සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සංවිධානය ද, හඳුනාගත් විශේෂ කණ්ඩායම් වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කිරීම ද 2022 වසර තුළ සාර්ථකව සිදු කරන ලදි.

එලෙසම පැවති අඩුපාඩු මඟහරවා ගනිමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පර්යේෂණ රසායනාගාරයේ කටයුතු නැවත ආරම්භ කිරීම ද 2022 වසරේ දී ලද කාර්ය සාධනයේ ප්‍රගතියක් ලෙස හඳුනාගත හැකි ය.

සමස්ත වසර පුරා ම මෙවැනි වූ විශිෂ්ට කාර්ය සාධනයක් දක්වමින් ආයතනයේ මෙහෙවර නිසි අයුරින් දියත් කිරීමට උරදුන් සියලු පාර්ශවයන්ට මා කෘතඥ වන අතර, දැක්වූ විශිෂ්ට කාර්ය සාධනය සහ එහි ප්‍රගතිය වෙනුවෙන් සුභ පැතුම් එක් කරමි. තවද අප ආයතනය පිහිටුවා වසර 10ක් සම්පූර්ණ වීමට නියමිත 2023 වසරේදී ද වඩාත් කැපවූ මෙහෙවරක් සඳහා සියලුම පාර්ශවයන්ට ඇරයුම් කරමි.

මහාචාර්ය අර්ජුන ද සිල්වා
සභාපති

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



තහනම් උත්තේජකත්, තහනම් ක්‍රමත් ක්‍රීඩාව තුළ දී මුලිනුපුටා දමමින් පිරිසිදු ක්‍රීඩා පරිසරයක් බිහිකිරීම සඳහා වූ උදාරතර අරමුණ පෙරදැරි කරගත් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය 2022 වර්ෂයේ දී සිය අභිමානවත් 9වන වසර ඇරඹීය. පුරා වසර 9ක කාලයක් තුළ දී ශ්‍රී ලංකාවෙහි අව්‍යාජ ක්‍රීඩා සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමෙහිලා අප ආයතනය විසින් සිදු කරන ලද මෙහෙය ප්‍රශංසනීය වේ. 2022 වසර ආරම්භයේ දී අප රටෙහි පැවති ගෝලීය වසංගත උවදුර හා වසර මැද දී උද්ගත වූ ආර්ථික අභියෝග මධ්‍යයේත් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සිය වගකීම මැනවින් ඉටු කිරීමට කටයුතු කරන ලදි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රධාන ශ්‍රීනික කාර්යක් වන තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කිරීම වසර පුරා අවස්ථානුකූල පරිදි සිදු කරන ලදි. එවැනි පරීක්ෂණ 138ක් 2022 වසර තුළ නිම කිරීමට හැකි විය. එහිදී ක්‍රීඩාවෙන් පිටත (Out of Competition) හා ක්‍රීඩාව තුළ දී (In Competition) ක්‍රීඩකයන් තහනම් උත්තේජක පරීක්ෂණ සඳහා යොමු කෙරුණි. 2022 වසර තුළ පැවතියා වූ අභියෝග මධ්‍යයේ තහනම් උත්තේජක භාවිතය වැළැක්වීම පිණිස දැනුවත් කිරීම් වැඩසටහන් 46 ක් පැවැත්වූ අතර ඒ සඳහා ක්‍රීඩික ක්‍රීඩිකාවන්, ක්‍රීඩා පුහුණුකරුවන් හා ක්‍රීඩා ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන විවිධ පාර්ශවකරුවන් රැසක් සහභාගී විය. 2022 වසරේ සමස්ත සහභාගීත්වය 1854කි.

ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතය වැළැක්වීම පිණිස බලාත්මක කර ඇති 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතෙහි විධිවිධානයන් පිළිබඳ ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන් හට අවබෝධයක් ලබා දීම වෙනුවෙන් ද වැඩසටහන් ගණනාවක් මෙම වසර තුළ දී පවත්වන ලදි. තහනම් ද්‍රව්‍ය අඩංගු ආහාර අතිරේක හා හැකියා වර්ධක ඖෂධ මගින් ක්‍රීඩා ක්ෂේත්‍රයට සිදු වෙන අහිතකර බලපෑම පිළිබඳ ඖෂධවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදි.

2022 වසර තුළ දී ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව හැදෑරූ වෛද්‍යවරුන් ගණනාවකට අප ආයතනය මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීමට කටයුතු කෙරුණි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ සෘජු මැදිහත් වීම මත පාසල් සිසුන්ගේ පාසල් පෙළ පොත් සඳහා තහනම් උත්තේජක ද්‍රව්‍ය පිටුදැකීම පිළිබඳ විෂය කරුණු ඇතුළත් කිරීමට කටයුතු කරන ලදි. 2024 වසරේ දී 6,8 සහ 10 ශ්‍රේණි සඳහාත් 2025 වසරේ දී 7,9 සහ 11 ශ්‍රේණි සඳහා නියමිත ශාරීරික අධ්‍යාපන විෂය යටතේ මෙම කරුණු පාසල් පෙළ පොත් සඳහා ඇතුළත් කිරීමට හැකියාව ලැබී ඇත.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පවතින පර්යේෂණාගාරය තුළ Liquid Chromatography Triple Quadrupole Mass Spectrophotometer (LC-MS/MS) යන්ත්‍රයක් ඇතුළු අතිනවීන පර්යේෂණ උපකරණ අන්තර්ගතව පවතී. මෙය අප ජීවත් වන දකුණු ආසියාතික කලාපයේ පවතින අතිනවීන පර්යේෂණාගාරයකි. මෙම යන්ත්‍රය ස්ථාපිත කර ක්‍රියාකාරීත්වයට ගෙන ඒමට 2022 වසරේ දී තුළ අපට හැකිවිය. මෙය භාවිතයෙන් රසායනාගාර පර්යේෂණ සිදු කිරීමටත්, එමගින් පර්යේෂණ ලිපි සකස් කිරීමටත්, ඒවා ජාත්‍යන්තරය සමඟ හුවමාරු කර ගැනීමටත් හැකියාව ලැබෙනු ඇත. පර්යේෂණ සිදු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන් සඳහා සිය රසායනාගාර පර්යේෂණ සිදු කිරීමට, අපගේ පර්යේෂණාගාරය භාවිතා කිරීමට අවස්ථාව දීම තුළින් ආයතනය සඳහා අමතර මුදල් ඉපයීමක් ද ජනිත කර ගැනීමට හැකිවනු ඇත.

මෙම වසර තුළ දී ඉටු කළ මෙහෙවර, ඉදිරි වර්ෂවල දී තව දුරටත් පුළුල් කිරීමට අපි

බලාපොරොත්තු වෙමු. එය වඩා තිරසර වූත්, අව්‍යාජ වූත් ක්‍රීඩා සංස්කෘතියක් අප රටෙහි බිහි කරලීමට මහත් රුකුළක් වනු ඇත. 2022 වසර තුළ දී අප ලබා ගත් සාර්ථකත්වයට දායක වූ සියලු පාර්ශවයන්ට කෘතවේදීත්වය පළ කරන අතර වර්තමානයේ මෙන් ම අනාගතයේ දීත් ශ්‍රී ලංකාවේ පිරිසිදු ක්‍රීඩාවට විශාල තිරසර සේවයක් සිදු කිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට හැකි වේවා යැයි මම සුභාශිංසන එක් කරමි.

වෛද්‍ය සිවලී ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන

අධ්‍යක්ෂ මණ්ඩලය - 2022



මහාචාර්ය අර්ජුන ද සිල්වා
සභාපති



මහාචාර්ය ලාල් ජයකොඩි
සාමාජික



මහාචාර්ය රවින්ද්‍ර ප්‍රනාන්දු
සාමාජික



ඩබ්.ඒ.කුලසූරිය මහතා
සාමාජික



ඒ.ජේ.එස්.එස්.එදිරිසූරිය මහතා
සාමාජික



වෛද්‍ය ලාල් ඒකනායක මහතා
සාමාජික



සජීත් ජයලාල් මහතා
සාමාජික



එච්.එම්.එම්.එස්.ධර්මවර්ධන මහතා
සාමාජික



වෛද්‍ය අන්වර් හම්ඩානි
සාමාජික



වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන
සාමාජික

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

නීතිමය තත්ත්වය.

ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක ගැනීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ ප්‍රතිපාදන ක්‍රියාත්මක වෙමින්, ඊට ආදාළ දේශීය නෛතික යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (SLADA) පිහිටුවන ලදී.

මෙම ආයතනය 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්.

2013 අංක 33 දරන ක්‍රීඩාවේ යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 15 වන වගන්තිය යටතේ නියෝජ්‍යායතනයේ පරමාර්ථවලට සම්බන්ධ යම් කාරණයක් හෝ සියලු කාරණා පිළිබඳ ව අමාත්‍යවරයා විසින් යොමු කරනු ලබන යම් කාරණයක් පිළිබඳව ද අමාත්‍යවරයාට උපදෙස් දීම මණ්ඩලයේ වගකීම වේ. තව ද පනතේ අංක 16 වන වගන්තිය ප්‍රකාර ව, අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් කලින් කලට විශේෂ හෝ පොදු විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

පරිපාලන භූමිකාව.

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතට අනුව, නියෝජ්‍යායතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.

නියෝජ්‍යායතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින්, මේ පනත මගින් නියෝජ්‍යායතනය වෙත පවරන ලද හෝ ඒ මත පනවන ලද හෝ එයට භාරදෙන ලද බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම කළ යුතු ය.

නායකත්ව භූමිකාව.

එහි නායකත්ව භූමිකාව තුළ, අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරීවලට, පාලනය සහ පහත සඳහන් ක්‍රියාකාරිත්වයට මහ පෙන්වීම ඇතුළත් විය යුතු ය.

* උත්තේජක මර්දන ක්‍රියා සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
* උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීම්වලට එරෙහිව පියවර ගැනීම.
* යම් චංචල හෝ නිශ්චල දේපලක් (විකිණීමෙන්, ත්‍යාග මගින් හෝ අන්‍යාකාරයකින්) අත්කර ගැනීමට, දැරීමට, බද්දට හෝ දීමට, උකස් කිරීමට, ඔඩපනය කිරීමට සහ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.
* කිසියම් බැංකුවක ජංගම සහ ඉතිරිකිරීමේ ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යෑම.
* ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර තැනැත්තන්ගේ හෝ පුද්ගල මණ්ඩලවලින් පරිත්‍යාග භාර ගැනීම.

* නියෝජ්‍යායතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි කර්තව්‍යන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු ම ගිවිසුම්වලට ඇතුල් වීම හෝ ඉටු කිරීම.
* නියෝජ්‍යායතනයට අයිති මුදල් කිසිවක් ආයෝජනය කිරීම.
* එහි කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයක් ණයට ගැනීම.
* මෙම පනත යටතේ නියෝජ්‍යායතනයේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, පරිශ්‍රමය දීම හා ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඒ සේවකයන් පහ කිරීම.
* නියෝජ්‍යායතනය විසින් සපයන ලද සේවා සහ සහාය වෙනුවෙන් ගාස්තු අය කිරීම.
* එහි කර්තව්‍යන් ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය යැයි නියෝජ්‍යායතනය අදහස් කරන වෙනත් යම් සියලු දේ සිදු කිරීම.

<u>සංයුතිය.</u>

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළුව සාමාජිකයින් දස දෙනෙකුගෙන් සමන්විත වේ.

- මහාචාර්ය අර්ජුන ද සිල්වා - සභාපති
- සජිත් ජයලාල් මහතා - සාමාජික
- ඒ.ජේ.එස්.එස්.එදිරිසූරිය මහතා - සාමාජික
- වෛද්‍ය. නිහාල් මුණසිංහ මහගමගේ - සාමාජික (2022 ඔක්තෝම්බර් මස සිට සාමාජිකත්වයෙන් ඉවත් විය.)
- එස්.අයි.එම්.රෝසා මහතා - සාමාජික (2022 පෙබරවාරි මස සිට සාමාජිකත්වයෙන් ඉවත් විය.)
- ඩබ්ලිව්.ඒ.කුලසූරිය මහතා - සාමාජික
- වෛද්‍ය.ලාල් ඒකනායක - සාමාජික
- මහාචාර්ය ලාල් ජයකොඩි - සාමාජික
- වෛද්‍ය.අන්වර් හම්දානි - සාමාජික
- මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු - සාමාජික
- එච්.එම්.එම්.එස්.ධර්මවර්ධන මහතා (2022 මාර්තු මස සිට සාමාජිකත්වයට පත් කරන ලදි)
- වෛද්‍ය.රුක්ෂාන් බෙල්ලන (2022 නොවැම්බර් මස සිට සාමාජිකත්වයට පත් කරන ලදි)

රැස්වීම් සහ පැමිණීම.


අධ්‍යක්ෂ මණ්ඩලය 2022 වසර සඳහා අවස්ථා 12ක දී රැස් වූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ පැමිණීම පහත සඳහන් පරිදි වේ.

නම	20th ජනවාරි	17th පෙබරවාරි	31st මාර්තු	21st අප්‍රේල්	19th මැයි	30th ජූනි	28th ජූලි	18th අගෝස්තු	22nd සැප්තැම්බර්	20th ඔක්තෝම්බර්	22nd නොවැම්බර්	15th දෙසැම්බර්
මහාචාර්ය අර්ජුන ද සිල්වා	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓
මහාචාර්ය ලාල් ජයකොඩි	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓
මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	_
ඩබ්ලිව්.ඒ.කුලසූරිය	✓	✓	_	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓
ඒ.ජේ.එස්.එස්.එදිරිසූරිය	✓	_	✓	✓	_	✓	_	✓	✓	✓	✓	✓
වෛද්‍ය ලාල් ඒකනායක.	✓	✓	✓	✓	✓	✓	_	✓	✓	✓	✓	✓
සජීත් ජයලාල් මහතා	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓
වෛද්‍ය. අන්වර් හම්දානි.	✓	✓	_	✓	_	_	_	_	✓	_	✓	_
වෛද්‍ය. රුක්ෂාන් බෙල්ලන											✓	✓
එච්.එම්.එම්.එස්.ධර්මවර්ධන මහතා			✓	_	✓	✓	✓	✓	✓	✓	✓	✓
වෛද්‍ය.නිහාල් මුණසිංහ මහගමගේ	_	_	_	_	_	_	_	_	_	_		
එස්.අයි.එම්.රෝසා මහතා	_	_										

අපගේ කාර්ය මණ්ඩලය



සංවිධාන ව්‍යූහය


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)
සහකාර අධ්‍යක්ෂ
කළමනාකරණ සහකාර
පර්යේෂණ නිලධාරි(03)
තාක්ෂණ සහකාර (01) (පර්යේෂණාගාර)
ගණකාධිකාරි
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සහකාර
තොරතුරු තාක්ෂණ නිලධාරි
සංවර්ධන නිලධාරි
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
සංවර්ධන නිලධාරි (01)
තාක්ෂණ සහකාර (01)
කළමනාකරණ සහකාර
රියදුරු (04)
කාර්යාල කාර්‍ය සහායක (03)
නීති නිලධාරි/මාණ්ඩලික ලේකම්
අධ්‍යක්ෂ(බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම)
සහකාර අධ්‍යක්ෂ
කළමනාකරණ සහකාර
HM
MM 1.1
AR-1
JM
MA-4
MA-3
MA1-1
MA 2-1
PL-3
PL-1

කාර්ය මණ්ඩල තොරතුරු

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත 29දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත.

	තනතුරු නාමය	**වැටුප් තලය**	**තනතුරු සංඛ්‍යාව**	**වර්තමාන සේවක සංඛ්‍යාව**	**පුරප්පාඩු සංඛ්‍යාව**
01.	අධ්‍යක්ෂ ජනරාල්	HM 2-1	1	1	
02.	අධ්‍යක්ෂ	HM 1-1	2		2
03.	සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ	MM 1-1	2	2	
04.	ගණකාධිකාරි	MM 1-1	1	1	
05.	නීති නිලධාරි/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	MM 1-1	1	1	
06.	පර්යේෂණ නිලධාරි	AR 1	3	2	1
07.	පරිපාලන නිලධාරි	JM 1-1	1	1	
08.	තොරතුරු තාක්ෂණ නිලධාරි	JM 1-1	1		1
09.	භාෂා පරිවර්තක	MA-4	1	1	
10.	සංවර්ධන නිලධාරි	MA 3	3	1	2
11.	කළමනාකරණ සහකාර	MA 1-1	4	4	
12.	තාක්ෂණ සහකාර	MA 2-1	2	1	1
13.	රියදුරු	PL 3	4	2	2
14.	කාර්යාල කාර්ය සහයක	PL 1	3	2	1
එකතුව			**29**	**19**	10

මෙහෙයුම් ප්‍රගතිය

අධ්‍යාපන හා පරීක්ෂණ අංශය

අපගේ ජීවිතයට ක්‍රීඩාව මෙතරම් සමීප වන්නේ කායික මානසික නිරෝගීකමට වඩා, ආධ්‍යාත්මික ශික්ෂණයෙන් ද, මනා පෞරුෂයෙන් ද හෙබි පරිපූර්ණ මිනිසකු බිහි කිරීමට එමගින් ලැබෙන මහඟු දායකත්වය නිසා ය. ශතවර්ෂ 25කටත් වඩා ඈතට දිවෙන අභිමානවත්,ප්‍රෞඪ ඉතිහාසයක් හිමි ජාත්‍යන්තර ක්‍රීඩාව, වර්තමානය වන විට අතිශ්‍ය දියුණු හා ඉතා සංකීර්ණ තත්ත්වයකට පත් ව තිබේ. එය කෙමෙන්, කෙමෙන් නවීකරණයටත්, වාණිජකරණයටත් ලක් වන විට එහි ප්‍රමුඛ තේමාවක් වූ "ක්‍රීඩාශීලි සහභාගිත්වය" නමැති සංකල්පයේ වැදගත්කම ද ටිකෙන් ටික යටපත් වී, "හුදු ජයග්‍රහණය ම" හඹා යෑමේ නියත ඉලක්කයන් හා ඒකායන අභිලාශයන් නූතන ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ වර්ධනය වී ඇත. වර්තමාන ක්‍රීඩාව මෙතරම් සංවිධානාත්මක වී, දියුණු වී හා වර්ධනය වී ඇත්තේත්, ඊට ඉහළ ම තරගකාරිත්වයක් ආරෝපණය වී ඇත්තේත් එම ක්ෂේත්‍රය තුළ දැන් පවතින මේ දැඩි ජයග්‍රහණ පිපාසය නිසාවෙනි.

තවද, ක්‍රීඩාව කෙමෙන් වැඩී, වර්ධනය වී, එහි තරගකාරී බව ද වැඩි වී අතිනවීන හා දියුණු තාක්ෂණික උපක්‍රම හා මෙවලම් නූතනයේ දී ඊට අනුබද්ධ වන විට, ඒවා ක්‍රමවත් ව මෙහෙයවීමේ, හැසිරවීමේ හා පාලනය කිරීමේ පොදු නීතිරීති පද්ධතියක අවශ්‍යතාව හා වැදගත්කම දැඩි ව ඉස්මතු වෙයි. ක්‍රීඩාවේ දී තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම භාවිතා කිරීම පාලනය කිරීමට අදාළ නීතිරීති දෙස් විදෙස් ක්‍රීඩා ක්ෂේත්‍රයන් තුළට ඇතුළත් වී ඇත්තේත් මෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

තහනම් ද්‍රව්‍ය හා තහනම් ක්‍රම භාවිතයේ ඇති අතිශය භයානක ප්‍රතිඵල වනුයේ එමගින් අතිදක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මුලුමහත් ක්‍රීඩා දිවිය ම අකලට මිලින වී යෑමත්, ඒ තුළ ඔවුන්ගෙන් ලැබීමට තිබෙන ජාත්‍යන්තර මට්ටමේ වටිනා ක්‍රීඩා ජයග්‍රහණ නිරපරාදේ රටට අහිමි වීමත්, ජගත් කෙළිබිමේ දී ප්‍රසිද්ධියට පත්වන මෙවැනි ආන්දෝලනාත්මක සිදුවීම් නිසා මුලුමහත් රටටත්, ජාතියටත් බලවත් අවමානයක් හා අපකීර්තියක් සිදුවීමත් ය. අනෙක් අතට, වත්මන් ක්‍රීඩාවෙහි නියැලෙන රටේ ජීවනාලිය බඳු ජාතියේ මතු පරපුරෙහි ශාරීරික හා මානසික නිරෝගීතාවය හා යෝග්‍යතාවය පිරිහී ගොස් රෝගී සමාජයක් අනාගතයේ දී බිහිවීමට ඇති ඉඩකඩ වැඩිවීම ද දිගුකාලීන වශයෙන් මෙහි පවත්නා තවත් ගැටලුවකි. එබැවින් තහනම් උත්තේජක භාවිතයෙන් වැළකී සිටීමේ වැදගත්කම අවධාරණය කරමින් මෙරට ක්‍රීඩක පරපුර සහ ඔවුන්ගේ සියලු සහායක පිරිස් දැනුවත් කිරීම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධ්‍යාපන අංශයේ මූලික පරමාර්ථය යි.

ඒ අනුව, 2022 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා සිදු කළ තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ ව විස්තර පහත පරිදි වේ. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ ක්‍රීඩා ක්ෂේත්‍රය් නියැලෙන්නන් අරමුණු කරගෙන මෙම වැඩසටහන් දීපව්‍යාප්ත ව ක්‍රියාත්මක කරන ලදී.

2022 වර්ෂයට අදාළ තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ සාරාංශ ගත තොරතුරු

ජාතික ක්‍රීඩා කණ්ඩායම් හා ජාතික සම්මේලන





කනිෂ්ඨ ජාතික සංචිත හා නැගී එන කණ්ඩායම්





ක්‍රීඩා සමාජ, ත්‍රිවිධ හමුදා හා පාසැල් ක්‍රීඩා කණ්ඩායම්





ක්‍රීඩාව හා සම්බන්ධ උපාධි අපේක්ෂකයන්





උත්තේජක පාලන නිලධාරීන්, උත්තේජක පාලන සහායකවරුන් හා ක්‍රීඩා වෛද්‍යවරුන්






ප්‍රදර්ශන කුටි හා අත්පත්‍රිකා බෙදාදීමේ කඳවුරු






2022 වර්ෂයට අදාළව දැනුවත් කිරීමේ වැඩසටහන් ඉලක්කයන් සහ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.


	ඉලක්ක ගත අගය		සත්‍ය අගය	
කාර්තුව	වැඩමුළු ප්‍රමාණය	සහභාගීත්වය	වැඩමුළු ප්‍රමාණය	සහභාගීත්වය
Q1	10	375	12	506
Q2	9	350	7	244
Q3	11	400	12	567
Q4	10	375	15	537
එකතුව	40	1500	46	1854






තහනම් උත්තේජක පරීක්ෂණ

ශ්‍රී ලංකාව තුල තහනම් උත්තේජක භාවිතයෙන් තොර පිරිසිදු ක්‍රීඩා පරිසරයක් බිහිකිරීමත් පිරිසිදු ක්‍රීඩක ක්‍රීඩිකාවන් ආරක්ෂා කිරීමත් අරමුණු කරගනිමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් 2022 වසර තුළ සිදුකරන ලද තහනම් උත්තේජක පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.







අනු අංකය	ක්‍රීඩාව	තරග තුළදී සිදුකළ තහනම් උත්තේජක පරීක්ෂණ	තරග වලින් පිටතදී සිදුකළ තහනම් උත්තේජක පරීක්ෂණ	මුළු තහනම් උත්තේජක පරීක්ෂණ ගණන	තහනම් උත්තේජක ලබාගත් බවට සනාථ වූ අවස්ථා
1.	රග්බි	16	4	20	-
2.	මලල ක්‍රීඩා	29	6	35	-
3.	පාපැදි	12	-	12	03
4.	බර ඉසිලීම	13	9	22	-
5.	ක්‍රිකට්	10	-	10	-
6.	බැඩ්මින්ටන්	-	2	2	-
7.	සවි එසවීම	9	-	9	02
8.	පැරා මලලක්‍රීඩා	3	4	7	-
9.	බොක්සින්	4	-	4	-
10.	මල්ලවපොර	-	5	5	-
11.	ජිම්නාස්ටික්	-	2	2	-
12.	පැසිපන්දු	-	4	4	-
13.	බේස්බෝල්	4	-	4	-
14.	ස්කොෂ්	-	2	2	-
	එකතුව	**100**	**38**	**138**	**05**



එක් එක් ක්‍රීඩාව අනුව සිදු කරන ලද තහනම් උත්තේජක පරීක්ෂණ ගණන හා තහනම් උත්තේජක ලබාගත් බවට සනාථ වූ අවස්ථා ගණන





නීති අංගය

2022 වසරේ ප්‍රගතිය

- තහනම් උත්තේජක ලබාගත් බව තහවුරු වූ ක්‍රීඩකයන් සඳහා 2022 වසරේ දී,
    - පවත්වන ලද මූලික පරීක්ෂණ ගණන - 9
    - පවත්වන ලද විනය පරීක්ෂණ ගණන - 9
    - පවත්වන ලද අභියාචන පරීක්ෂණ ගණන - 7
- පවත්වන ලද සියලු ම විනය සහ අභියාචන පරීක්ෂණවල සටහන් සහ තීන්දු සම්බන්ධ ලේඛන කටයුතු අවසන් කිරීම.
- තහනම් උත්තේජක ලබාගත් බව තහවුරු වූ අවස්ථාවේ සිට අවසාන තීන්දුව ලබාදෙන තෙක් එක් එක් ක්‍රීඩකයාට අදාළ සම්බන්ධීකරණ කටයුතු කිරීම සහ ලිපි ගොනු පවත්වාගෙන යාම.
- වසර තුළ දී සංවිධානය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන - 12
- 2022 වසර සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙන් ප්‍රකාශ කළ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව ගැසට් පත්‍රයේ පළ කිරීම සහ පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීම හා සම්බන්ධ කටයුතු සම්පාදනය කිරීම
- අධ්‍යාපන වැඩසටහන් වලදී තහනම් උත්තේජක සම්බන්ධ නෛතික පසුබිම පිළිබඳ දැනුවත්කිරීම් සිදුකිරීම.
- ලෝක තහනම් උත්තේජක සම්බන්ධ නීති තත්ත්වයේ යාවත්කාලීනවීම් සඳහා අනුගත වෙමින් ලංකාව තුළ තහනම් උත්තේජක සම්බන්ධ නීති තත්ත්වය ක්‍රියාත්මක කිරීම.

2023 වසර සඳහා ඉලක්ක

- මාසික ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය සහ වාර්තා නිසි පරිදි පිළියෙල කිරීම.
- තහනම් උත්තේජක ලබාගත් බව තහවුරු වන සියලු ම ක්‍රීඩකයන් සඳහා මූලික පරීක්ෂණ විනය පරීක්ෂණ සහ අභියාචනා පරීක්ෂණ නියමිත පරිදි පවත්වා අවසන් කිරීම.
- තහනම් උත්තේජක ලබාගත්බව තහවුරු වූ අවස්ථාවේ සිට අවසාන තීන්දුව ලබාදෙන තෙක් එක් එක් ක්‍රීඩකයාට අදාළ සම්බන්ධීකරණ කටයුතු කිරීම සහ ලිපි ගොනු පවත්වාගෙන යාම.
- විනය පරීක්ෂණ සහ අභියාචනා පරීක්ෂණ තීන්දු නිසි පරිදි සකස්කර අදාළ පාර්ශව අතර සන්නිවේදනය කිරීම.
- ලෝක තහනම් උත්තේජක සම්බන්ධ නීති තත්ත්වයේ යාවත්කාලීනවීම් සඳහා අනුගත වෙමින් ලංකාව තුළ තහනම් උත්තේජක සම්බන්ධ නීති තත්ත්වය ක්‍රියාත්මක කිරීම.
- 2023 වසර සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙන් ප්‍රකාශ කළ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව ගැසට් පත්‍රයේ පළ කිරීම සහ පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීම හා සම්බන්ධ කටයුතු සම්පාදනය කිරීම.
- 2023 වසර සඳහා අන්තර්ජාතික අශ්ව ක්‍රීඩා සම්මේලනය මගින් ප්‍රකාශ කළ අශ්ව ක්‍රීඩා සහ තුරඟ තරග සඳහා වන තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව ගැසට් පත්‍රයේ පළ කිරීම සහ පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීම හා සම්බන්ධ සියලු කටයුතු සම්පාදනය කිරීම.
- අධ්‍යාපන වැඩසටහන්වල දී තහනම් උත්තේජක සම්බන්ධ නෛතික පසුබිම පිළිබඳ ව දැනුවත්කිරීම් සිදුකිරීම.

බලාත්මක කිරීම් හා ක්‍රියාත්මක කිරීමේ අංශය

බලාත්මක කිරීම් හා ක්‍රියාත්මක කිරීමේ අංශය මගින් 2022 වර්ෂය තුළ පොලිස් නිලධාරීන් උදෙසා විධිමත් පරිදි අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහන් 06ක් සිදුකර ඇත. එසේම බලාතමක කිරීම හා ක්‍රියාත්මක කිරීමේ අංශයේ විශේෂ පැමිණිලි ඒකකයට මේ වන විට පැමිණිලි 09ක් ලැබී ඇත. (2022 වර්ෂය අවසන් වන විට). පාසැල් මළල ක්‍රීඩා තරගාවලියට සමගාමී ව සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණය තුළ තහනම් උත්තේජක හා තහනම් උත්තේජක ක්‍රම භාවිතයන් පිළිබඳ විශේෂ පැමිණිලි ලබා ගැනීම හා දැනුවත් කිරීමේ කුටියක් ද (Outreach Booth) ස්ථාපිත කරන ලදී.

මේ අනුව බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීමේ අංශයේ 2022 වර්ෂයට අදාළ ප්‍රගතිය

වැඩසටහන	වැඩසටහන් ගණන	සහභාගී වූ සංඛ්‍යාව
පවත්වන ලද පුහුණු කිරීමේ වැඩසටහන්	06	1907
දැනුවත් කිරීමේ කුටි (outreach Booth) Training programs)	01	1000ක් පමණ
විශේෂ පැමිණිලි ගණන	07	07
Internal Initials Reviews	07	07

බලාත්මක හා ක්‍රියාත්මක කිරීමේ අංශය මගින් 2022 වර්ශයේ මුල් ම දැනුවත් කිරීමේ වැඩසටහන ලෙස 2022 පෙබරවාරී මස 11වන දින කලුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පොලිස් නිලධාරීන් 61 දෙනෙක් උදෙසා පවත්වන ලදී.





දෙවන දැනුවත් කිරීමේ වැඩසටහන ලෙස 2022 අප්‍රේල් මස 08 වන දින මහනුවර කුණ්ඩසාලේ පොලිස් අභ්‍යාස විද්‍යාලයේ නිලධාරීන් 165 දෙනෙක් සඳහා පවත්වන ලදී.





තුන්වන දැනුවත් කිරීමේ වැඩසටහන ලෙස 2022 ජූනි මස 02 වන දින නිකවැරටිය පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පොලිස් නිලධාරීන් 330 දෙනෙක් සඳහා පවත්වන ලදී.





<u>හතරවන දැනුවත් කිරීමේ වැඩසටහන ලෙස 2022 අගෝස්තු මස 23 වන දින ඇල්පිටිය පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පොලිස් නිලධාරීන් 55 දෙනෙක් සඳහා පවත්වන ලදී.</u>







<u>පස්වන දැනුවත් කිරීමේ වැඩසටහන ලෙස 2022 සැප්තැම්බර් මස 15 වන දින මහියංගණය පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පොලිස් නිලධාරීන් 632 දෙනෙක් සඳහා පවත්වන ලදී.</u>





<u>හයවන දැනුවත් කිරීමේ වැඩසටහන ලෙස 2022 සැප්තැම්බර් මස 16 වන දින බොරලන්ද පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පොලිස් නිලධාරීන් 664 දෙනෙක් සඳහා පවත්වන ලදී.</u>





පාසැල් මළල ක්‍රීඩා තරගාවලියට සමගාමීව 2022 වර්ෂයේ දෙසැම්බර් මස 02 දින සිට 06 දක්වා සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණය තුළ තහනම් උත්තේජක හා තහනම් උත්තේජක ක්‍රම භාවිතයන් පිළිබඳ විශේෂ පැමිණිලි ලබා ගැනීම හා දැනුවත් කිරීමේ කුටියක් (Outreach Booth) ස්ථාපිත කරන ලදී. මෙහිදී සියලු ම ක්‍රීඩාවන් ආවරණය වන පරිදි ක්‍රීඩක ක්‍රීඩිකාවන් 1000කට වැඩි ප්‍රමාණයක් දැනුවත් කිරීමට හැකි විය.








ඒ අනුව මෙම වර්ෂය තුළ දී විශේෂ පැමිණිලි සහ තහනම් උත්තේජක අභ්‍යන්තර විමර්ශන 07ක් ද සිදු කර ඇත. මෙම වසර තුළ විශේෂ පැමිණිලි ඉදිරිපත් වී ඇත්තේ පහත ක්‍රීඩා සම්බන්ධවයි.

මළල ක්‍රීඩා	01
පා පැදි	03
බර ඉසිලීම	02
ක්‍රිකට් අක්‍රමිකතා	01

<u>2023 වර්ෂය තුළ බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීමේ අංශයෙහි වාර්ෂික සැලැස්ම (Annual Plan)</u>

පුහුණු වැඩසටහන් (Training Programs)	**05**
දැනුවත් කිරීමේ කුටි (outreach Booth) Training programs	**04**
විශේෂ පැමිණිලි ගණන	**12**
Internal Initials Reviews	**04**

දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් 05ක් මෙම 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර දැනුවත් කිරීමේ කුටි (Outreach Booth) පුහුණු වැඩසටහන් 04 ක් පැවැත්වීමට සූදානම් කර තිබේ. මෙම වර්ෂය තුළ දී කාර්තුවකට විශේෂ පැමිණිලි 03 බැගින් වර්ෂය තුළ දී පැමිණිලි 12 ක් විමර්ශනය කිරීමට සැලසුම් කරගෙන සිටින අතර මෙම ප්‍රමාණය මීට වඩා වැඩිවිය හැක. එසේම මූලික අභ්‍යන්තර විමර්ශන වාර්තා කාර්තුවකට 01 බැගින් වර්ෂය තුළ 04ක් සිදු කිරීමට බලාපොරොත්තු වන අතර මෙම ගණන ද වෙනස්විය හැක.

තහනම් උත්තේජක පරීක්ෂණ අනුව තහනම් උත්තේජක භාවිතා කර ඇති අවස්ථාවක එම පරීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර විමර්ශනයක් සිදු කිරීමේ අවශ්‍යතාවය මත මෙම අභ්‍යන්තර විමර්ශන වාර්තා අදාළ කමිටු වෙත ඉදිරිපත් කළ යුතු ය.

පර්යේෂණ අංශය


1. LC/MS/MS උපකරණයේ performance qualification test එක සහ පුහුණුව Shimadzu application specialist ගෙන්වාගෙන සාර්ථකව අවසන් කිරීම.



- Shimadzu විශේෂඥයා විසින් LC/MS/MS උපකරණයේ පැවති තාක්ෂණික ගැටලු නිරාකරණය කිරීමට උත්සහ කිරීම.



- පර්යේෂණ නිලධාරීන් Shimadzu විශේෂඥයා විසින් පුහුණු කරනු ලැබේ.



- LC/MS/MS උපකරණය මගින් මුත්‍රා සාම්පල විශ්ලේෂණය සඳහා නියැදි සකස් කිරීම.

2. LC/MS/MS උපකරණයේ performance test එකෙහි ගුණාත්මක භාවය දේශීය විශේෂඥයින්ගෙන් සැදුම් ලත් කමිටුවක් මඟින් සනාථ කර ගැනීම.



➢ වෛද්‍ය උත්පලි මන්නපෙරුම,
ඖෂධවේදය පිළිබඳ කථිකාචාර්ය,
කොළඹ විශ්වවිද්‍යාලය.

➢ කමනි පෙරේරා මිය,
රජයේ ජ්‍යෙෂ්ඨ රස පරීක්ෂක.




➢ වෛද්‍ය දනුෂා තම්බරවිට,
ඖෂධවේදය පිළිබඳ කථිකාචාර්ය,
කොළඹ විශ්වවිද්‍යාලය.



➢ මහාචාර්ය ලාල් ජයකොඩි.

❖ LC/MS/MS උපකරණ ක්‍රියාකාරීත්වය ඇගයීමේ කමිටු සාකච්ඡාව.

3. 2014 සිට 2020 දක්වා තහනම් උත්තේජක නීති කඩ කිරීම් පිළිබඳ පසුබිම් අධ්‍යනය සහ පර්යේෂණයේ Abstract වාර්තාව අන්තර්ජාතික සමුළුවක දී ප්‍රකාශයට පත් කිරීම.



AESA 7th International Conference on Sports Science
By: Asian Exercise and Sport Science Association (AESA)- 2023

HOME IMPORTANT DATE ABSTRACT SUBMISSION ARCHIVES ETHICS & POLICIES CONFERENCE TEAM

HOME / ARCHIVES /
VOL 6 NO 1 (2022): VOL 6 NO 1 (2022): THE 6TH INTERNATIONAL CONFERENCE OF SPORTS SCIENCE- AESA / Abstract

An overview of anti-doping rule violations in Sri Lankan sports from 2014 to 2020

Oral Presentation

PNJ Fernando
1Sri Lanka Anti-Doping Agency, P.O. Box 363/12, Sugathadasa Stadium- Block D, Stadium Parking road, Sirimavo Bandaranaike Mawatha, Colombo 14, Sri Lanka

SAN Rashani
Sri Lanka Anti-Doping Agency, P.O. Box 363/12, Sugathadasa Stadium- Block D, Stadium Parking road, Sirimavo Bandaranaike Mawatha, Colombo 14, Sri Lanka

S Pigera
Sri Lanka Anti-Doping Agency, P.O. Box 363/12, Sugathadasa Stadium- Block D, Stadium Parking road, Sirimavo Bandaranaike Mawatha, Colombo 14, Sri Lanka

MA Niriella
Faculty of Medicine, University of Kelaniya, Kelaniya, Sri Lanka

SJ Jayawickreme
Sri Lanka Anti-Doping Agency, P.O. Box 363/12, Sugathadasa Stadium- Block D, Stadium Parking road, Sirimavo Bandaranaike Mawatha, Colombo 14, Sri Lanka

AP de Silva
Faculty of Medicine, University of Kelaniya, Kelaniya, Sri Lanka

ABSTRACT

WATCH ONLINE PRESENTATION


PUBLISHED

2022-03-07

- ක්‍රීඩා විද්‍යාවේ 6වැනි ජාත්‍යාන්තර සමුළුවේ දී වාචික ඉදිරිපත් කිරීම.

4. දේශීය ක්‍රීඩා පුහුණුකරුවන්ගේ පෝෂණය පිළිබඳ දැනුම විෂ්ලේෂණයට සැලසුම් කරන ලද පර්යේෂණයේ දත්ත එකතු කර අවසන් කිරීම.

5. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ක්‍රීඩක ක්‍රීඩිකාවන් ආහාර අතිරේක භාවිතය පිළිබඳ කරන ලද පර්යේෂණ Abstract වාර්ථාව අන්තර්ජාතික විද්‍යාත්මක සැසියක ප්‍රකාශයට පත් කිරීම.



World Academy of Science, Engineering and Technology
International Journal of Sport and Health Sciences
Vol:16, No:03, 2022

Prevalence of Dietary Supplements among University Athlete Regime in Sri Lanka: A Cross-Sectional Study

Authors : S. A. N. Rashani, S. Pigera, P. N. J. Fernando, S. Jayawickema, M. A. Niriella, A. P. De Silva

Abstract : Dietary supplement (DS) consumption is drastically trending among the young athlete generation in developing countries. Many athletes try to fulfill their nutrition requirements using dietary supplements without knowing their effects on health and performance. This study aimed to assess the DS usage patterns of university athletes in Sri Lanka. A self-administered questionnaire was employed to collect data from state university students representing a university team, and a sample of 200 respondents was selected based on a stratified random sampling technique. Incomplete questionnaires were omitted from the analysis. The data were analyzed using IBM SPSS statistics for Windows version 25. The level of significance was set at $p<0.05$ in the data analysis. The prevalence of DS was 48.2% (n= 94), with no significant association between gender and DS intake. Protein (15.9%), vitamin (14.9%), sports drinks (12.8%), and creatine (8.2%) were the most consumed DS by students. Weightlifting (85.0%), football (62.5%), rugby (57.7%), and wrestling (40.9%) players showed higher DS usage among other sports. Coaches were reported as the most frequent person who was advised to use DS (43.0%). Students who won interuniversity games showed significantly low DS intake ($p = 0.002$) compared to others. Interestingly, DS use was significantly affected by the season of use ($p = 0.000$), pointing out that during competition and training seasons (62.4%) was the most frequent use. The pharmacy (27.0%) was the commonest place to buy DS. Students who used nutrient-dense meal plans during the training and competition period still showed a 61.0% tendency to consume DS. Most claimed reason to use DS was to increase energy and strength (29.0%). A majority reported that they used DS for less than one month (35.5%), while the second-highest duration was over three years (17.2%). Considering body mass index (BMI), healthy weight students showed 71.0% DS prevalence. DS prevalence was moderate among Sri Lankan university students, highlighting that the highest DS use was during competition and training seasons. Moreover, it emphasizes the need for nutrition and anti-doping counseling in the Sri Lankan university system.

Keywords : athlete, dietary, supplements, university
Conference Title : ICSS 2022 : International Conference on Sport Science
Conference Location : Sydney, Australia
Conference Dates : March 28-29, 2022

6, No:03, 2022 publications.waset.org/abstracts/145242/pdf

- ❖ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ ජාත්‍යාන්තර සමුළුවේ වාචික ඉදිරිපත් කිරීම.

6. ශ්‍රී ලංකාවේ උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් පවත්වනු ලබන තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන විශ්ලේෂණය සහ එමගින් ලංකාවේ ක්‍රීඩාව තුළ තහනම් උත්තේජක භාවිතය මර්දනය කිරීමට සිදු කරන බලපෑම අධ්‍යනයට සිදු කරන ලද පර්යේෂණයේ Abstract ප්‍රකාශනයක් අන්තර්ජාතික විද්‍යාත්මක සැසියට ඉදිරිපත් කිරීම.



7th International Conference of Sport Science – AESA 2023

An Evaluation of Anti-Doping Education program of Sri Lanka Anti -Doping Agency in preventing doping among athletes

SAN Rashani [*,1], S.Pigera[1] ,PNJ Fernando [1] ,S Jayawicrema[1], S Pilipitiya [3] ,AP De Silva[1,2]

[1]Sri Lanka Anti Doping Agency, [2]University of Kelaniya, [3] Institute of Sports Medicine


Background: This study was conducted to evaluate the anti-doping awareness program (ADAP) according to the knowledge of prohibited substances, doping rules, doping behavior and moral adjustment in preventing doping among Sri Lankan athletes.

Methods: Data was collected from 200 athletes. A questionnaire was used to collect data in pre, post and follow-up sessions. Knowledge of anti-doping rules and prohibited substances were measured as unintentional doping, while doping behavior and moral detachment were intentional doping measures. Participants were asked to respond on a Likert- type scale to determine athlete satisfaction. Results were statistically analyzed using non -parametric tests.

Results: A repeated measures ANOVA determined that doping knowledge score differed significantly between 3 time points ($F = 27.54$, $P < 0.000$). Post hoc analysis revealed knowledge score was significantly increased from pre to post (-6.65 (95% CI, -8.45 to -4.85), $p < .000$), and pre to follow up (- 4.265 (95% CI, -7.045 to -1.486), $p = .001$), but not from post to 3 months later (2.38 (95% CI, 0.38 to 4.38), $p = 0.014$).Moral affinity has significantly decreased from pre to post (0.01) but not significant changed in follow up. Doping behavior did not show significant change (0.264).

❖ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ 7 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය මගින් සාරාංශය පිළිගෙන ප්‍රකාශයට පත් කිරීමට නියමිත වේ.

7. ආහාරමය අතිරේක භාවිතය නිසා ඇති වන සෞඛ්‍යමය ගැටලු සෙවීමේ පර්යේෂණයේ පූර්ණ පර්යේෂණ වාර්තාව Asian Food Science ජර්නලයේ ප්‍රකාශයට පත් කිරීම.



Asian Food Science Journal

21(5): 47-54, 2022; Article no.AFSJ.85801
ISSN: 2581-7752

Retrospective Study on Health Impact of Dietary Protein, Vitamin and Electrolyte Supplementation: A Pilot Study

P. N. J. Fernando [a*], S. Pigera [a], S. A. N. Rashani [a], S. J. Jayawickrema [a] and A. P. de Silva [a,b]

[a] Sri Lanka Anti-Doping Agency, Colombo, 01400, Sri Lanka.
[b] Faculty of Medicine, University of Kelaniya, Kelaniya, 11300, Sri Lanka.

Authors' contributions

This work was carried out in collaboration among all authors. Author PNJF designed the study, did the literature search, wrote protocol, carried out the work, performed statistical analysis, wrote the first draft of the manuscript. Author SP designed the study and carried out the work. Author SANR performed statistical analysis. Authors SJJ carried out the work and edited the first draft of the manuscript. Author APS was supervisor of the piece of work. All authors read and approved the final manuscript.

Article Information

DOI: 10.9734/AFSJ/2022/v21i530430

Open Peer Review History:
This journal follows the Advanced Open Peer Review policy. Identity of the Reviewers, Editor(s) and additional Reviewers, peer review comments, different versions of the manuscript, comments of the editors, etc are available here: https://www.sdiarticle5.com/review-history/85801

Original Research Article

Received 12 February 2022
Accepted 21 April 2022
Published 28 April 2022

- Asia food science journal යන ජර්නලයෙහි ඉහත සඳහන් පර්යේෂණයේ පූර්ණ පර්යේෂණ වාර්තාවක් ප්‍රකාශනයට පත් කර ඇත.



තිරසාරභාවය පිළිබඳ වාර්තාව

"ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැප වී සිටින අතර, එය ස්වකීය ආයතනික අරමුණු හරහා ශ්‍රී ලාංකීය ක්‍රීඩකයින්ට ක්‍රමයෙන් නියත හා තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි."

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මූලික වශයෙන් ම තිරසාරභාවය පවත්වාගත් ආයතනයකි. ආරම්භයේ සිට ම
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හුදෙක් එහි ආසන්නතම පාර්ශවකරුවන්ගේ සුබසිද්ධියට වඩා වැඩි යමක් සැළකිල්ලට ගනිමින් ක්‍රීඩකයින්ගේ සමස්ත දිගු කාලීන අවශ්‍යතා හා සාරධර්ම සමඟ නොගැටෙන බව සහතික ලෙස විශ්වාස කරයි. මණ්ඩලයේ තිරසාරභාවය පිළිබඳ වාර්තාව එහි පැතිකඩ, තිරසාරභාවය සඳහා වන උපායමාර්ග, ආර්ථික වගකීම, සමාජ වගකීම සහ පාරිසරික වගකීම යන ඒවායින් සමන්විත වේ.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැප වී සිටින අතර එය ස්වකීය අරමුණ ළඟා කර ගැනීම හරහා ක්‍රීඩකයින්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි. මෙම වාර්තාව මගින් සමාජ, පාරිසරික හා ආර්ථික වගවීම පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගෙන ඇති ක්‍රියාමර්ග අවධාරණය කර ඇත. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි සමාජ වගකීමට නියෝජ්‍යායතනයේ, ක්‍රීඩකයන්ගේ සහ ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති වගකීම් සහගත ක්‍රියාමාර්ග ඇතුළත් වේ. පාරිසරික වගකීම සාක්ෂාත් කර ගැනීම පිණිස අපගේ නියෝජ්‍යායතනය ස්වකීය ආයතනික ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම අධීක්ෂණය කරමින් පරිසර හිතකාමී ආයෝජන සිදු කරයි. ආර්ථික වගකීම, විනිවිදභාවයෙන් යුතු සහ සමබර වන පාලන ආකෘතියක් බවට පරිවර්තනය වෙයි.

අපගේ මූලික සාරධර්ම

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය කැපවීමෙන් යුතු සහ දැඩි ලෙස උද්යෝගීමත් සේවකයින් සම්බන්ධයෙන් සඳහන් කිරීමේ දී, ඔවුන් අපට අති මහත් සහයෝගයක් ලබා දී ඇත. තමන් ද එහි කොටසක් වීම ගැන ඔවුන්ට ආඩම්බර විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමට අප මහත් සේ වෙහෙසෙන්නේ එබැවිනි. අපගේ ශ්‍රම බලකායෙහි විශිෂ්ටත්වය සහ සාර්ථකත්වය දිරිගැන්වීම පිණිස පුහුණුව සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා දීම මගින් අප අපගේ සේවක පිරිස සඳහා ආයෝජනය කරනුයේ අපගේ ආයතනයේ සාර්ථකත්වය රඳා පවතින්නේ තම රැකියාව පිළිබඳ ව ඔවුන්ගේ ඇති තෘප්තිමත්භාවය මත වන බව අපි අවබෝධ කර ගෙන සිටින බැවිනි.

පාරිසරික වගකීම

පරිසරයට වන බලපෑම අවම කිරීම සඳහා අප විසින් දරන ලද ප්‍රයත්නයන් සාර්ථක වී ඇත. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සේවකයන් සඳහා පරිපූර්ණ පුහුණුව, නව්‍ය තාක්ෂණය සහ පාර්ශවකරුවන් සමඟ සහයෝගීතාවය හරහා ඵලදායී සහය සේවාවන් සපයා දීමට දොරටුවක් විවර කර දෙයි. අප විසින් ඇන්ඩ්‍රොයිඩ් App යෙදවුම හඳුන්වා දීම මෙම අරමුණුවලට සාක්ෂි වේ. ඩිජිටල්කරණය හරහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්වකීය ක්‍රීඩකයින්ගේ පහසුව උදෙසා වැඩි වැඩියෙන් යෙදවුම් සහ ඊ-සේවා හඳුන්වා දෙමින් පෘථිවිය මත කාබන් පියසටහන අවම කිරීමට ඉලක්ක කරයි. අපි පාරිසරික බලපෑම පිළිබඳ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මෙහෙයුම් වැඩිදියුණු කිරීමට සහ සේවකයින් අතර හරිත දැනුවත්භාවයක් වැඩි කිරීමට ද අදහස් කරන්නෙමු. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය තිරසාර වටිනාකමක් නිර්මාණය කරමින් කැප වූ සංවර්ධනයක් කෙරෙහි අවධානය යොමු කරයි. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්වකීය ආයතනික ව්‍යායාමයන්හි පාරිසරික බලපෑම් අධීක්ෂණය කරන අතර පාරිසරික වගකීම ඉටුකිරීම පිණිස බලශක්තිය ඉතිරි කිරීමේ ආයෝජනය ද සිදු කරයි.

අපගේ සමාජ වගකීම

අපගේ ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්ති පදනම් කරගෙන අපව වටිනා ප්‍රජා සාමාජිකයෙකු ලෙස පිළිගනු ලැබීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අපට අවශ්‍ය ය. එම නිසා අර්ථාන්විත, දිගුකාලීන හවුල්කාරිත්වයන් තුළින් ක්‍රීඩකයන්ට සහ ප්‍රජාවට දායකත්වය සපයා දීමට සහ පාරිසරික වශයෙන් තිරසාර ආකාරයකින් ආයතනික කටයුතු කරගෙන යාමට
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අවධානය යොමු කරයි.

මානව සම්පත්

යහපත් ව්‍යාපාරික පිළිවෙත් සංවර්ධනය කිරීමේ දී සහ කල් පවත්නා පාරිභෝගික සම්බන්ධතා ගොඩනැගීමේ දී අපගේ සේවකයිනගේ වැදගත් කාර්යභාර්ය අපි පිළිගැනීමට ලක් කරන්නෙමු. අපි අපගේ සේවකයින්ව ඉතා දැඩි ලෙස අගය කරන අතර, ඔවුන් ලබා දෙන ඉතා වටිනා දායකත්වයන් පිළිබඳ අපගේ ඇගයීම පෙන්නුම් කිරීම සඳහා නව්‍ය, සහයෝගී සහ ආකර්ෂණීය සේවා ස්ථානයක් නිර්මාණය කර ලබා දුන්නෙමු.

කාර්ය මණ්ඩල සංවර්ධනයෙහි අරමුණු

- රැකියා සහ වෘත්තීය අවස්ථා නිර්මාණය කිරීම හා දිරිමත් කිරීම.
- ශ්‍රම බලකාය සැලසුම් කිරීම සහ නිපුණතා කළමනාකරණ වැඩසටහන්, ගුණාත්මක බඳවා ගැනීම් සහ රඳවා ගැනීමේ ක්‍රියාමාර්ග, නායකත්ව සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය සංවර්ධනය කිරීම සහ අඛණ්ඩ අධ්‍යාපනික දැනුම ලබා දීම අඛණ්ඩව වැඩිදියුණු කිරීම.
- අපගේ සේවකයින්ව සවිබල ගන්වනු ලබන බව සහ ඔවුන්ගේ ජයග්‍රහණ සඳහා ඔවුන්ට දිරිගැන්වීම් ලබා දෙනු ලබන බව සහතික කිරීම.
- ආයතනික ක්‍රමෝපායික දිශාව පිළිබඳ ව අපගේ කාර්ය මණ්ඩලය හොඳින් දැනුවත් කර සහ දැන සිටී බව සහතික කිරීම.

ආයතනික පාලනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන පාලන පද්ධතියෙහි තීරණ ගැනීම සඳහා වන පරිවයන් මත මගපෙන්වීමේ ප්‍රතිපත්ති නිර්වචනය කර දෙන අතර ම, නියෝජ්‍යායතනයේ දිගු කාලීන අරමුණු සහ උපාය මාර්ගික සැලසුම්වලට මග පෙන්වයි. ආයතනික පාලන ආකෘතිය මගින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි විවිධ මට්ටම් අතර, විශේෂයෙන් ම පාලනයෙහි මට්ටම් අතර, එනම් අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක කළමනාකරණ මට්ටම් අතර බලතල සහ වගකීම බෙදී යන ආකාරය සංක්ෂිප්ත ව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික ප්‍රතිපත්ති ස්ථාපනය කරන අතර, අප ආයතනයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා වගකිව යුතු පුද්ගලයින් වන ප්‍රධාන විධායක නිලධාරී සහ විධායක නිලධාරීන්ට ක්‍රමෝපායික මග පෙන්වීමක් සපයා දෙයි.

අප ආයතනය 2013 අංක 13 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත මගින් පාලනය වේ. එම පනතෙහි 14(i) වගන්තිය මගින් මණ්ඩලයේ ව්‍යූහය පහත සඳහන් පරිදි දක්වා ඇත.

(අ) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයින්:

i. ක්‍රීඩා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයාගේ නිලයට වඩා අඩු නොවන ධුරයක් දරන නිලධරිවරයා;
ii. ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ-ජනරාල්වරයා;
iii. ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;
iv. ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා;

(ආ) අමාත්‍යවරයා විසින් පත්කරන ලද නීතිය, ක්‍රීඩා වෛද්‍ය සහ ක්‍රීඩා විද්‍යාව යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයට පත් වූ (මෙහි මින්මතු ‘‘පත්කළ සාමාජිකයන්’’ යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා පත් කළ යුතු අතර, මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා ද එම සභාපතිවරයා මණ්ඩලයේ කටයුතු පරිපාලන හා කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාර්ය

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල ව අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජ්‍යායතනයේ කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ය. සියලු ව්‍යවස්ථාපිත හා කළමනාකරණ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වන අතර ම, සම්පත් ආරක්ෂා කිරීම, ප්‍රමාණවත් පරිදි ගිණුම් පවත්වා ගැනීම සහ නිවැරදි වාර්තා සම්පාදනය කිරීම සහතික කරමින් මෙය ඉටු කරගත යුතු ය.
එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් දෑ සහතික කළ යුතු ය:

- සංවිධානයේ උපයමාර්ගික අරමුණු ක්‍රියාත්මක ව පවතින බව සහතික කිරීම
- උපයමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය ලබා දීම
- ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහ අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක ව වන බවට සහතික කිරීම
- ආයතන කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම
- නිතිපතා වන පදනමකින් අවශ්‍ය කරනු ලබන මූල්‍ය අංග සහ අනාවරණයන් පිළිබඳ ව ප්‍රමාණවත් ලෙස වාර්තා කිරීම
- සම්පත් හා වත්කම් වගකීමෙන් යුතු ව භාවිතා කිරීම
- විගණන කමිටුව සහ අනෙකුත් කමිටු පත් කිරීම; සහ වර්යාධර්ම හා ආචාරධර්ම පද්ධතියක් සහ ආයතනික පාලන උපාය මාර්ගයක් හඳුන්වා දීම
- අදාළ අණ පනත්, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ආදිය ප්‍රකාර ව ඔවුන්ගේ සියලු ක්‍රියාමාර්ග සඳහා වගකිව යුතු වීම
- අවම වශයෙන් වාර්ෂිකව හෝ ප්‍රධාන විධායක සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය පිළිබඳ ඇගයීමක් කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

නියෝජ්‍යායතනයේ මෙහෙයුම් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ප්‍රතිඵල අයවැය සහ අදාළ ප්‍රමිතින්ට අනුකූල ව දැඩි ලෙස හා නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සවිස්තරාත්මක ව අවශ්‍ය කරන අනෙකුත් කාරණා සමඟ සම්මත න්‍යාය පත්‍රයක් අනුගමනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස් වන අතර අවශ්‍ය ඕනෑ ම අවස්ථාවක විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට කටයුතු කරයි.

නියෝජ්‍යායතනයේ පිහිටුවා ඇති කමිටු

1. විකිත්සකමය භාවිත මුක්තිය පිලිබඳ කමිටුව (T.U.E.)
2. විනය මුල මණ්ඩලය
3. අභියාචනා මුල මණ්ඩලය
4. විගණන සහ කළමනාකරණ කමිටුව
5. ප්‍රසම්පාදන කමිටුව

කළමනාකාරිත්වය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ දෛනික මෙහෙයුම් කටයුතු ප්‍රධාන විධායක නිලධාරීගේ හා ඉහළ කළමනාකාරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරණ කණ්ඩායම් වෙත පවරා තිබේ. අවදානම් සහ අවස්ථාවන් හඳුනා ගනු ලබන බව සහ නියමිත වේලාවලට අවශ්‍ය පියවර ගනු ලබන බවත්, ඉලක්ක සපුරා ගැනීම සඳහා අයවැය සකස් කරනු ලබන බවත් එම කණ්ඩායම් විසින් සහතික කරනු ලබයි.

.

අවදානම් කළමනාකරණ වාර්තාව

ඵලදායී අවදානම් කළමනාකරණය උත්තේජක මර්දන ක්‍රියාවලියේ ප්‍රධාන සාධකයකි. අප ආයතනයේ අවදානම් හා ප්‍රතිඵල අතර උචිත සමතුලිතතාවයක් ඇති කර ගැනීමට සහ පාලිත පරිසරයක් තුළ අපගේ වර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට උපකාරී වන අවදානම් කළමනාකරණ හැකියාවන් අඛණ්ඩ ව වැඩි දියුණු කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු. අවදානම් කළමනාකරණය ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතන මෙහෙයුම් ව්‍යූහයේ ප්‍රධානතම අංගයක් වේ. මුහුණ දීමට සූදානම් ව සිටින අවදානම් මට්ටම ඇතුළත අවදානම් නිරාවරණය වීම් කළමනාකරණය කිරීම මගින් ඉපැයීම්වල සහ ප්‍රාග්ධනයෙහි අහිතකර විචලනයන් සීමා කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු.

අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම සඳහා වගකීම් සහතික ප්‍රවේශයක් කළමනාකරණ පද්ධතියට ඇතුළත් වේ. අවදානම් දැනුවත් කිරීමේ වර්යාවන්ට සහාය දෙන ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ එමගින් අවදානම් මත පදනම් ව තීරණ ගැනීමට අනුබලය දීම අපගේ ප්‍රධාන අවධානය වී තිබේ. ආයතනයේ දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා අපි අපගේ අවදානම් උපායමාර්ග තවදුරටත් වැඩිදියුණු කරන්නෙමු.

ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අවදානම් කළමනාකරණ උපායමාර්ග විශේෂිත පාර්ශවකරුවන්, කළමනාකරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා ප්‍රතිපෝෂණ ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වේ. ආයතනයේ ව්‍යාපාර, මෙහෙයුම්, පද්ධති සහ සේවාවන් සඳහා දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීමේ උපායමාර්ගික කේන්ද්‍රයක් ලෙස එයට හිමි වන තත්ත්වයෙන් එය සුවිශේෂී වේ. මෙය පහත සඳහන් දෑ හරහා ව්‍යාපාර අවදානම්වලට ආමන්ත්‍රණය කිරීම සඳහා උපායමාර්ගික සහ ව්‍යාපාරික සැලසුම්කරණයට, ව්‍යාපෘති කළමනාකරණයට සහ ව්‍යාපාර ක්‍රියාවලි මට්ටම්වලට ස්ථාවර ප්‍රවේශයක් සපයා දෙයි:

- ව්‍යාපාර කාර්යයන් සහ ඒකක පුරා ඇති අවදානම් පිළිබඳ පොදු අවබෝධයක් ලබා දීම.
- වැඩිදියුණු වූ ප්‍රමුඛතා නියම කරගැනීම සහ තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස කළමනාකරණයට අඛණ්ඩ අවදානම් තක්සේරුවක් සපයා දීම.
- සේවක දැනුවත්භාවය සහ කළමනාකරණ වගකීම් වැඩි කිරීම ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පහත සඳහන් කර ඇති පරිදි විශේෂිත අවදානම් සමූහයකට යටත් වේ.

මූල්‍ය අවදානම

අකාර්යක්ෂම මුදල් ප්‍රවාහ කළමනාකරණය හා මූල්‍ය තොරතුරු සම්බන්ධ අවදානම් මගින් ආයතනවල ඵලදායිතාවයට හානි ගෙන දිය හැකි ය. ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ආයතනය පුරා පිරිවැය පාලන උපාය මාර්ග සම්බන්ධීකරණය කිරීම වැනි මූල්‍ය අවදානම් කළමනාකරණ පිළිවෙත් භාවිතා කරයි.

මෙහෙයුම් අවදානම

පද්ධති ඇනහිටීම්, පුද්ගලයින් අතින් සිදුවිය හැකි දෝෂ, සාපරාධී ක්‍රියාකාරකම් හෝ අභ්‍යන්තර පද්ධතිමය බිඳවැටීම් හේතුවෙන් සිදුවිය හැකි පාඩු මෙහෙයුම් අවදානම්වලට අයත් වේ. එවැනි තත්ත්වයන් මගින් පාරිභෝගික විශ්වාසයට හා ආයතනික ප්‍රතිරූපයට හානි සිදු විය හැකිය. මෙහෙයුම් අවදානම අවම කිරීම පිණිස ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නිරතුරුව ම අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කරයි. ආයතනික අවදානම මගින් ඇති වන තර්ජනය අවම කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් මෙහෙයුම් ඒකක සහ ව්‍යාපාර ක්‍රියාවලි පිළිබඳ නිරන්තර අවදානම් තක්සේරු කිරීම් සිදු කරනු ලබයි.

නීති අවදානම

ආයතනයට එරෙහිව ගනු ලැබිය හැකි අනාගතම නීතිමය ක්‍රියාමාර්ග වලින් ආරක්ෂා වීමට අපොහොසත් වීම නීතිමය හානි සිදුවීමේ අවදානම වැඩි කරයි. ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිළිගත් නීති ඍත්තිකයන්ගේ උපදෙස් ලබා ගෙන එවැනි ක්‍රියාමාර්ග අවම කිරීම සඳහා සුදුසු පියවර ගෙන තිබේ.

තොරතුරු තාක්ෂණ අවදානම

තොරුතුරු තාක්ෂණ පද්ධතිය මගින් ලබා ගන්නා නිශ්චිත හා කාලෝචිත තොරුතුරු ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනහි මෙහෙයුම් ක්‍රියාවලියේ මූලික ම අංගයක් වේ. ආයතනය ස්වකීය තොරුතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් දියත් කර ඇත.

විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කරන්නෙමු.

විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනා (03) ගෙන් සමන්විත වේ.

1. එච්.එම්.එස්.ධර්මවර්ධන මයා - සභාපති
   (අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ව්‍යාපාර දෙපාර්තමේන්තුව)
2. ඩබ්ලිව්.ඒ.කුලසූරිය මයා - සාමාජික
   (අතිරේක ලේකම්, පාලන, ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශය)
3. වෛද්‍ය ලාල් ඒකනායක මයා සාමාජික
   (අධ්‍යක්ෂ ජනරාල්, ජා.ක්‍රී. වෛද්‍යායතනය)

අධ්‍යක්ෂ ජනරාල්, ගණකාධිකාරී, පරිපාලන නිලධාරී සහ අනෙකුත් අදාල නිලධාරීන් මෙම රැස්වීම්වලට සහභාගී වීම අනිවාර්ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී සහ ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මෙම කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වේ.

විගණන කමිටුවේ කාර්යභාර්ය

පිරිසිදු ක්‍රීඩාවක් ස්ථාපිත කිරීම හා ආයතනය සතු වත්කම් ආරක්ෂා කරගැනීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වාගත යුතු ය. මුදල් අමාත්‍යාංශය සහ අදාළ බලධාරීන් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ ද කමිටුව විසින් අනුගමනය කරනු ලබයි. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී විගණන කමිටුව විසින් එහි ප්‍රධාන වගකීම්වලට අදාලව සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

1.අනුමත වාර්ෂික විගණන සැලැස්මට අනුකූල ව වරින්වර සිදුකරන ලද අභ්‍යන්තර විගණන පිළිබඳ කාලීන විගණන වාර්තා අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම අභ්‍යන්තර විගණන වාර්තා මගින් ආයතනයේ ක්‍රියාත්මක ව පවතින පද්ධති හා ක්‍රියාපටිපාටිවල ඇති අඩුපාඩු අවධාරණය කර පෙන්වා දෙන අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරු ව අවශ්‍ය අවස්ථාවන් හි පවතින ක්‍රමවේද හා කාර්ය පටිපාටිවල වැඩිදියුණු කිරීම් නිර්දේශ කර, කළමනාකරණ හා විගණන කමිටුවට ප්‍රගතිය වාර්තා කරයි. විගණන කමිටුවට අභ්‍යන්තර විගණනයෙන් නිසිපතා වාර්තා ලැබෙන අතර, එම කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද එක එක් විගණනය මගින් සොයා ගත් කරුණු පිළිබඳ සාරාංශයක් එම වාර්තාවලට ඇතුළත් වේ. කළමනාකරණයෙහි අදහස් ද එහි කොටසක් වන අතර, විගණනය විසින් නිරීක්ෂණය කර ඇති තත්වයන්ට හේතු වී ඇති මූලික කරුණු සහ එම තත්වයන්ට හේතු වී ඇති කරුණු සහ එම තත්වයන් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ද කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

2.අභ්‍යන්තර විගණනයේ හා රජයේ විගණනයේ සහය ඇති ව කමිටුව විසින් ආයතනයේ මෙහෙයුම් සහ මූල්‍ය පාලන සහ කාර්යපටිපාටිවල ඵලදායීතාවය තක්සේරු කරනු ලබන අතර, ඒවාට වියදම්, ආදායම් ක්‍රියාවලිය සහ ප්‍රාග්ධන වියදම් සඳහා අවසර දීමේ සීමා, අත්සන් කිරීමේ බලධාරීන්, තොරතුරු තාක්ෂණික යෙදවුම් පාලන හා සංවර්ධනය කිරීම, ආයතනික ව්‍යූහය, ප්‍රතිපත්ති, රාජකාරී වෙන් කර දීම සහ කළමනාකරණය විසින් සිදු කරනු ලබන සමාලෝචන ඇතුළත් වේ. ආයතනයෙහි මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දෘඪශීලතා තත්වය නිරන්තරයෙන් නිරීක්ෂණය කරන ලදි. එහි දී හඳුනා ගනු ලබන අඩු පාඩු අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා වන නිර්දේශ ද සහිතව වාර්තා කරනු ලැබේ.

පවත්වන ලද විගණන කමිටු රැස්වීම් ගණන

2022 වර්ෂය සඳහා රැස්වීම් හතරක් (04) පවත්වන ලද අතර ඒ සඳහා පැමිණීම පහත පරිදි වේ.

විගණන කමිටුව	පැමිණීම	නොපැමිණීම
එච්.එම්.එස්.ධර්මවර්ධන මයා	4/4	නැත
ඩබ්ලිව්.ඒ.කුලසූරිය මයා	4/4	නැත
වෛද්‍ය ලාල් ඒකනායක මයා	4/4	නැත
එච්.සුඩ් පෙරේරා	4/4	නැත
ඩී.එච්.කලංසූරිය මිය	4/4	නැත



එච්.එම්.එස්.ධර්මවර්ධන
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව



මූල්‍ය වාර්තා

විස්තීරණ ආදායම් ප්‍රකාශය

මූල්‍ය තත්ව ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

අවසාන ගිණුම් සඳහා සටහන්

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
මූල්‍ය තත්ව ප්‍රකාශය

ශේෂය	සටහන	**2022 දෙසැම්බර් 31**	**2021 දෙසැම්බර් 31**
		(ශ්‍රී ලංකා රුපියල්)	
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ	1	260,487,075.24	210,455,133.22
කාරක ප්‍රාග්ධන ප්‍රගතිය	2	-	60,211,400.00
		260,487,075.24	**270,666,533.22**
ජංගම වත්කම්			
තොගය	3	1,606,462.00	2,005,580.20
අයවිය යුතු දෑ	4	1,739,028.00	1,296,100.00
කලින් ගෙවූ වියදම්	5	236,249.79	384,224.03
මුදල් හා මුදල් හා සමාන දෑ	6	1,663,842.06	3,750,780.96
		5,245,581.85	**7,436,685.19**
මුළු වත්කම්		**265,732,657.09**	**278,103,218.41**
අරමුදල් හා වගකීම්			
මූල්‍යනය කළේ:			
භාණ්ඩාගාර ප්‍රතිපාදන	7	217,689,516.41	251,811,034.63
අමාත්‍යාංශ ප්‍රතිපාදන	8	691,964.51	1,445,090.38
සමුච්ත අරමුදල	9	8,633,057.43	6,314,053.91
ප්‍රත්‍යාගණන සංචිතය	10	23,502,228.35	2,547,085.96
		250,516,766.70	**262,117,264.88**
ජංගම වගකීම්			
ණයහිමියන් හා රඳවාගත් මුදල්	11	11,382,665.80	12,300,559.94
උපචිත වියදම්	12	1,211,855.06	1,228,036.09
ආපසු ගෙවියයුතු තැම්පතු		40,000.00	40,000.00
පාරිතෝෂිත වෙන් කිරීම්	13	2,581,369.53	2,417,357.50
		15,215,890.39	**15,985,953.53**
		265,732,657.09	**278,103,218.41**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලද්දේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රමිතීන්ට අනුකූලවය.

....
ඒ්‍ව්.ඒ්‍ම්.සි.ජී.දායාරත්න
ගණකාධිකාරී

.....
වෛද්‍ය සීවලී ජයවික්‍රම
අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරනු ලබයි.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබමි

.....
ඩබ්ලිව්.ඒ්. කුලසූරිය
අධ්‍යක්ෂ

.....
මහාචාර්ය අර්ජුන ද සිල්වා
සභාපති

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රකාශය

	සටහන	2022	2021
			(ශ්‍රී ලංකා රුපියල්)
භාණ්ඩාගාර ප්‍රතිපාදන	7	92,737,518.22	64,474,387.26
අමාත්‍යාංශ ප්‍රතිපාදන	8	753,125.87	753,122.50
වෙනත් ආදායම්	14	2,319,003.52	1,849,020.00
මුළු ආදායම්		95,809,647.61	67,076,529.76
පරිපාලන වියදම්	15	(93,490,644.09)	(65,227,509.76)
ශුද්ධ අතිරික්තය/(හිඟය)		**2,319,003.52**	**1,849,020.00**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2022	2021
		(ශ්‍රී ලංකා රුපියල්)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහයන්			
ශුද්ධ ලාභය		2,319,003.52	1,849,020.00
ගැලපීම්			
ක්ෂය		32,926,436.17	17,511,392.06
භාණ්ඩාගාර ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම්	7	(92,737,518.22)	(64,474,387.26)
		(57,492,078.53)	**(45,113,975.20)**
කාරක ප්‍රාග්ධන වෙනස් වීම්			
(වැඩි කිරීම්)/අඩු කිරීම් තොගය		399,118.20	(199,940.57)
(වැඩි කිරීම්)/අඩු කිරීම් අයවිය යුතු පරීක්ෂණ ගාස්තු		(442,928.00)	(605,060.00)
(වැඩි කිරීම්)/අඩු කිරීම් කලින් ගෙවූ වියදම්		147,974.24	(384,224.03)
වැඩි කිරීම්/ (අඩු කිරීම්) යලි ගෙවන රැඳවුම් මුදල්		-	(45,000.00)
වැඩි කිරීම්/ (අඩු කිරීම්) පාරිතෝෂික වෙන් කිරීම්	13	164,012.03	697,711.09
වැඩි කිරීම්/(අඩු කිරීම්) ගෙවිය යුතු දෑ හා රැඳවුම් මුදල්		(917,894.14)	-
වැඩි කිරීම්/(අඩු කිරීම්) උපචිත වියදම්		(16,181.03)	33,405.43
		(665,898.70)	**(503,108.08)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල්		**(58,157,977.23)**	**(45,617,083.28)**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහ			
දේපල පිරියත උපකරණ මිලදී ගැනීම්		(62,003,235.80)	(2,101,803.19)
කාරක ප්‍රාග්ධන ප්‍රගතිය		60,211,400.00	-
		(62,003,235.80)	**(2,101,803.19)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ			
භාණ්ඩාගාර ප්‍රතිපාදන		58,616,000.00	50,056,000.00
ලේකම් - ක්‍රීඩා අමාත්‍යාංශය		(753,125.87)	(753,122.50)
		57,862,874.13	**49,302,877.50**
වර්ෂය තුළදී මෙහෙයුම් තුළින් ජනිත වූ ශුද්ධ ලාභය (ප්‍රයෝජනයට ගන්නා ලද)		**(2,086,938.90)**	**1,583,991.03**
වර්ෂ ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ		**3,750,780.96**	**2,166,789.93**
වර්ෂ අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ		**1,663,842.06**	**3,750,780.96**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

(ශ්‍රී ලංකා රුපියල්)

	භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.	අමාත්‍යාංශ ප්‍රතිපාදන රු.	ප්‍රත්‍යාගණන සංචිතය රු.	සමුච්චිත ලාභය රු.	මුළු අගය රු.
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**266,081,050.16**	**2,951,335.38**	**-**	**1,537,638.00**	**270,570,023.54**
වසර තුළ අතිරේක	71,711,000.00	-	-	-	71,711,000.00
අරමුදල් ක්‍රමක්ෂය හා භාණ්ඩාගාර පියවීම්	(71,562,628.27)	(753,122.50)	-	-	(72,315,750.77)
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	-	2,927,395.91	2,927,395.91
ප්‍රත්‍යාගණන සංචිතය	-	-	2,547,085.96	-	2,547,085.96
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය- සංශෝධිත	**266,229,421.89**	**2,198,212.88**	**2,547,085.96**	**4,465,033.91**	**275,439,754.64**
වසර තුළ අතිරේක	50,056,000.00	-	-	-	50,056,000.00
අරමුදල් ක්‍රමක්ෂය	(64,474,387.26)	(753,122.50)	-	-	(65,227,509.76)
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	-	1,849,020.00	1,849,020.00
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**251,811,034.63**	**1,445,090.38**	**2,547,085.96**	**6,314,053.91**	**262,117,264.88**
වසර තුළ අතිරේක	58,616,000.00	-	-	-	58,616,000.00
අරමුදල් ක්‍රමක්ෂය	(92,737,518.22)	(753,125.87)	-	-	(93,490,644.09)
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	-	2,319,003.52	2,319,003.52
ප්‍රත්‍යාගණන සංචිතය	-	-	20,955,142.39	-	20,955,142.39
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**217,689,516.41**	**691,964.51**	**23,502,228.35**	**8,633,057.43**	**250,516,766.70**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

1. වාර්ථා කිරීමේ ආස්ථිත්‍යය

1.1 පොදු

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය 2013 නොවැම්බර් මස 11 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද 2013 අංක 33 දරණ උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතට අනුව ස්ථාපිත කරන ලදී. මෙම ආයතනයේ ලියාපදිංචි කාර්යාලය අංක 363/12, සුගතදාස ස්මේඩියම් - බ්ලොක් ඩී, ස්ටේඩියම් රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14 යන ලිපිනයේ පිහිටුවා ඇත.

1.1 .1 ආයතනයේ අරමුණු

a) ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිටුදැකීම සඳහා අවශ්‍ය වන යම් පියවර ගැනීම.
b) ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම සම්බන්ධ ක්ෂේත්‍ර හා අදාළ පර්යේෂණ සහ නියෝජ්‍යායතනය සහ සමාන කර්තව්‍ය ඉටු කරනු ලබන වෙනත් අන්තර්ජාතික සංවිධාන අතර අන්‍යොන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

1.1.2. ප්‍රකාශණ අනුකූලතාවය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ ගිණුම් සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලවය.

1.1.3. සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ඓතිහාසික පිරවැය පදනම යටතේය. මෙහිදී උද්ධමනීය සාධක සැලකිල්ලට ගනු නොලබයි.

1.1.4. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.

ශේෂපත්‍ර දිනට පසුව වියහැකි ප්‍රධාන ප්‍රතිවිපාක සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල හා ගිණුම් වල අනාවරණය කරනු ලබයි.

1.2. වත්කම් සහ අගය කිරීමේ පදනම

වර්ෂයක් තුළ මුදල් සහ බැංකු ශේෂය සහ මුදල් වලට පරිවර්ථනය කළ හැකි අයිතම සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ ජංගම වත්කම් ලෙස හඳුනාගෙන ශේෂ පත්‍රයේ විස්තර කර ඇත.

1.2.1 වත්කම්

දේපල පිරියත සහ උපකරණ වල අගය දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසුවය.

1.2.2 ක්ෂය

ක්ෂය ප්‍රතිපත්තිය සිදු කර ඇත්තේ සරළ මාර්ග ක්‍රමයටය. ක්ෂය කරනු ලබන්නේ වත්කම් අත්පත් කරගත් වර්ෂයේ සිට හෝ අදාළ වත්කමේ ඉදිකිරීම් කටයුතු අවසන් වූ වර්ෂයේ සිටය. වත්කමේ අපේක්ෂිත ඵලදායී ජීවකාලය තුළ ආදායම් සහ වියදම් ගිණුමෙන් ක්ෂය කපා හැරීම.

- පරිසණක සහ උපකරණ 25%
- ගෘහ උපකරණ 10%
- වෙනත් උපකරණ 25%
- මෝටර් වාහන 12.5%
- පර්යේෂණ උපකරණ 25%
- රසායනාගාර ගෘහ උපකරණ 10%
- ගොඩනැගිලි 5%

1.2.3 ප්‍රත්‍යාගණනය

සුදුසුකම් සහිත පුද්ගලයින් විසින් පරිසණක සහ උපකරණ,වෙනත් උපකරණ හා පර්යේෂණ උපකරණ සඳහා ප්‍රත්‍යාගණනය සිදුකරනු ලබයි. ප්‍රත්‍යාගණන අතිරික්තය වත්කමෙහි දළ ධාරණ අගය මත හඳුනාගෙන එහි ප්‍රත්‍යාගණන වටිනාකම ප්‍රත්‍යාගණන සංචිතයකට මාරු කරනු ලබයි

1.2.4 තොග

වසර අවසාන තොගය ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 9, ඡේද 16 ට අනුකූලව තක්සේරු කර ඇති අතර, හුවමාරු නොවන ගනුදෙනුවක් මාර්ගයෙන් තොග අත්පත් කරගත් අවස්තාවලදී ඒවායේ පිරිවැය ඒවා අත්පත් කරගත් දින පැවති සාධාරණ අගයට මනිනු ලැබේ. තොගවල සාධාරණ අගය/ ගැනුම් පිරිවැය (අ) ගැනුම් මිල, (ආ) ආනයන තීරු බදු සහ අනෙකුත් බදු සහ (ඇ) ප්‍රවාහන වියදම් හා පරිහරණ ගාස්තු සහ නිමි භාණ්ඩ අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාල වන අනෙකුත් පිරිවැය වලින් සමන්විතවේ. ආයතනයේ තොග පහත පරිදි වේ.

- මානව සම්පල් කට්ටල
- ලිපිද්‍රව්‍ය
- ටෝනර් සහ කාට්රිජ්

1.3. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හඳුනාගත් සියළුම වගකීම් ගිණුම්ගත කර ඇත.ශේෂපත්‍ර දින සිට වර්ෂයක් තුළ ගෙවිය හැකි හෝ ඉල්ලීමක් මත ගෙවිය හැකි වගකීම් ජංගම වගකීම් ලෙස ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇත.ගෙවීම සඳහා වර්ෂයකට වැඩි කාලයක් ගත වන වගකීම් ජංගම නොවන වගකීම් වේ.

1.3.1 සේවකයන්ගේ හිමිකම්.

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවා නියුකිතිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා දායකත්වය මූල්‍ය ප්‍රකාශනයේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

1.3.2. සේවකයන් සඳහා විශ්‍රාම පාරිතෝෂිත

සෑම සේවකයෙකු සේවයෙහි යෙදී පළමු වර්ෂය අවසන් වූ පසුව විශ්‍රාම පාරිතෝෂික වෙන් කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත. 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ පනතට අනුව මෙය සිදු කරනු ලබයි. සෑම වර්ෂයකම දෙසැම්බර් මස අවසාන දිනට ඇති කාර්යය මණ්ඩලයේ දළ වැටුපෙන් භාගයක් පාරිතෝෂිත සඳහා වෙන් කරනු ලබයි. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීමේ

පනතට අනුව මෙම ගෙවීම සිදු කරනු ලබන්නේ වසර 5 ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කරන ලද සේවකයින්ට පමණි.

1.4. ආදායම් ප්‍රකාශය

1.4.1 ආදායම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලවය අදාළ සේවාව ලබා දීමෙන් පසුව උපචිත පදනම මත ආදායම හඳුනාගනී.

1.4.2 වියදම්

වියදම් පිළිබඳ විස්තරයෙහි ලාභය හෝ අලාභය හඳුනාගන්නේ බදු අයකිරීමට පෙර හා හඳුනාගත් සියළු වගකීම් සඳහා වෙන්කිරීමෙන් පසුවය.

වත්කම් නඩත්තු කිරීමේ හා ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී දැරීමට වන වියදම් ශුද්ධ ඌනතාවය හෝ අතිරික්තය ගණනය කිරීමේ දී ආදායම් පිළිබඳ විස්තර වල ගලපනු ඇත.දුරකතන වියදම්, විදුලි වියදම් හා ජල බිල්පත් එම පහසුකම් සඳහා හිමිකම් කියන නිළධාරීන් හා සේවකයවන්ගෙන් අයකරනු ලබයි. එම වියදම් අදාල තීරු හි විස්තර කරනු ලබයි.

1.4.3 ප්‍රතිපාදන

ප්‍රතිපාදන හා ආධාර අදාල වියදම් සඳහා ගැලපෙන අයුරින් සකස් කර ඇත. වත්කම් හා සම්බන්ධ මූල්‍ය නොවන ප්‍රතිපාදන, මූල්‍ය වටිනාකම මත ගිණුම්ගත කල යුතු අතර එම වත්කම් ආදායම් ප්‍රකාශයේ වත්කමේ ඵලදායි ජීව කාලය තුල කපා හරිනු ඇත.

1.4.4 අනෙකුත් ප්‍රතිපාදන

අනෙකුත් ප්‍රතිපාදන සහ ආධාර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස ගිණුම්ගත කල යුතු අතර, වැඩසටහන අවසානයේ ඇති යම් මුදලක් තිබේ නම්, එය වෙනත් ආදායමක් ලෙස ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

1.5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.5.1 මුදල්

අතැති මුදල් හා ඉහළ ද්‍රවශීලතාවක් සහිත කිසිදු අවධානමකින් තොරව පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි වත්කම් මුදල් ලෙස හඳුනා ගනී. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවශ්‍යතාවය මත අතැති මුදල් හා බැංකු මුදල්, මුදල් ලෙස හඳුනා ගැනේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනුයේ වක්‍ර පදනමටය.

1.5.2. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.

ශේෂපත්‍ර දිනට පසුව වියහැකි ප්‍රධාන ප්‍රතිවිපාක සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල හා ගිණුම් වල අනාවරණය කරනු ලබයි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
2022 දෙසැම්බර් 31 න්
අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන 01
දේපල පිරියත සහ උපකරණ
(ශ්‍රී ලංකා රුපියල්)

පිරිවැය/ ප්‍රත්‍යාගණිත	**2022.01.01** දිනට ශේෂය	ප්‍රවර්ථන වර්ෂයේ එකතු කිරීම්	ප්‍රත්‍යාගණන ගැලපීම්	**2022.12.31** දිනට ශේෂය
ගොඩනැගිලි සහ සැලසුම්	216,986,038.04	203,931.53	-	217,189,969.57
ගෘහ භාණ්ඩ	873,436.35	-	-	873,436.35
පරිසණක සහ උපකරණ	2,739,780.00	366,154.27	-	3,105,934.27
වෙනත් උපකරණ	2,350,650.00	65,350.00	-	2,416,000.00
රථ වාහන -WPLW - 0353	6,024,980.00	-	-	6,024,980.00
පර්යේෂණ උපකරණ	11,445,500.35	61,367,800.00	2,943,500.35	69,869,800.00
රසායනාගාර ගෘහ උපකරණ	16,876,414.30	-	-	16,876,414.30
	257,296,799.04	**62,003,235.80**	**2,943,500.35**	**316,356,534.49**

සමුච්චිත ක්ෂය	**2022.01.01** දිනට ශේෂය	ප්‍රවර්ථන වර්ෂයේ එකතු කිරීම්	ප්‍රත්‍යාගණන ගැලපීම්	**2022.12.31** දිනට ශේෂය
ගොඩනැගිලි සහ සැලසුම්	32,330,345.76	10,859,498.48	-	43,189,844.24
ගෘහ භාණ්ඩ	606,072.92	87,343.73	-	693,416.65
පරිසණක සහ උපකරණ	684,945.00	776,483.57	-	1,461,428.57
වෙනත් උපකරණ	587,662.50	604,000.00	-	1,191,662.50
රථ වාහන -WPLW - 0353	3,517,057.13	753,125.87	-	4,270,183.00
පර්යේෂණ උපකරණ	5,740,299.65	18,158,343.09	23,898,642.74	-
රසායනාගාර ගෘහ උපකරණ	3,375,282.86	1,687,641.43	-	5,062,924.29
	46,841,665.82	**32,926,436.17**	**23,898,642.74**	**55,869,459.25**
2021.12.31 දිනට ලේඛණගත අගය	**210,455,133.22**	**29,076,799.63**	**(20,955,142.39)**	**260,487,075.24**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

		(ශ්‍රී ලංකා රුපියල්)
සටහන-2	**2022**	**2021**
කාරක ප්‍රාග්ධන ප්‍රගතිය		
පර්යේෂණ උපකරණ	-	60,211,400.00
	-	**60,211,400.00**

LC-MS/MS යන්ත්‍රය මිලදී ගැනීමේදී දරන ලද වියදම් ප්‍රාග්ධන වියදමෙහි ප්‍රගතියෙන් නිරූපනය කරනු ලබයි. පර්යේෂණ ඒකකය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක අවස්තාවේදී ප්‍රාග්ධන වියදමෙහි ප්‍රගතිය අදාළ වත්කම් ගිණුමට මාරු කරනු ලැබේ.

සටහන-03
තොග

අවසන් තොගය - මානව සාම්පල් කට්ටල	815,540.00	1,489,540.00
අවසන් තොගය - ලිපිද්‍රව්‍ය	578,615.00	236,220.00
අවසන් තොගය - ටෝනර් සහ කාට්රිජ්	212,307.00	279,820.20
	1,606,462.00	**2,005,580.20**

සටහන-04
අයවියයුතු දෑ

පරීක්ෂණ ආදායම් - ශ්‍රී ලංකා ක්‍රිකට් මණ්ඩලය	870,000.00	672,000.00
පරීක්ෂණ ආදායම් - රෝයල් ටර්ෆ් ක්ලබ්	714,100.00	624,100.00
පරීක්ෂණ ආදායම් - ජාත්‍යන්තර පැරාලිම්පික්	154,928.00	
	1,739,028.00	**1,296,100.00**

සටහන-05
කලින් ගෙවූ වියදම්

ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් (පුද්) සමාගම	6,486.26	4,864.70
මෙට්‍රොපොලිටන් ඔෆිස් (පුද්) සමාගම	2,880.00	2,880.00
ඔෆිස්ට්‍රොනික්ස් (පුද්) සමාගම	12,083.33	7,083.33
හේලීස් ඇවෙන්චුරා (පුද්) සමාගම	-	132,525.00
ජෝර්ජ් ස්ටුවර්ට් සොලූශන්ස් (පුද්) සමාගම	-	140,481.00
ඇමීගෝ ටෙක්නොලොජීස් (පුද්) සමාගම	-	96,390.00
සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සේවා	75,603.60	
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	139,196.60	
	236,249.79	**384,224.03**

සටහන-06
මුදල් සහ මුදල් හා සමාන දෑ

ලංකා බැංකුව - ගිණුම් අංක 75463697	1,663,842.06	3,750,780.96
	1,663,842.06	**3,750,780.96**

සටහන-7
භාණ්ඩාගාර ප්‍රතිපාදන

2022.01.01 දිනට ශේෂය	251,811,034.63	266,229,421.89
ගලා ඒම් -2022	58,616,000.00	50,056,000.00
අරමුදල් ක්‍රමක්ෂය 2022	(92,737,518.22)	(64,474,387.26)
2022.12.31 දිනට ශේෂය	**217,689,516.41**	**251,811,034.63**

සටහන-8	2022	2021
අමාත්‍යාංශ ප්‍රතිපාදන		
2022.01.01 දිනට ශේෂය	1,445,090.38	2,198,212.88
අරමුදල් ක්‍රමක්ෂය 2021	(753,125.87)	(753,122.50)
2022.12.31 දිනට ශේෂය	**691,964.51**	**1,445,090.38**

සටහන-9		
සමුච්ච අරමුදල		
ආරම්භක වර්ෂයේ ශේෂය	6,314,053.91	4,465,033.91
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා ලාභය මාරු කිරීම	2,319,003.52	1,849,020.00
වර්ෂ අවසානයේ ශේෂය	**8,633,057.43**	**6,314,053.91**

සටහන-10		
ප්‍රත්‍යාගණන සංචිත		
ප්‍රත්‍යාගණන සංචිත	2,547,085.96	2,547,085.96
ප්‍රත්‍යාගණන අතිරික්තය	20,955,142.39	-
වර්ෂ අවසානයේ ශේෂය	**23,502,228.35**	**2,547,085.96**

සටහන-11		
ණයහිමි හා රැඳවුම් ගිණුම්		
ජෝර්ජ් ස්ටුවර්ට් ඉංජිනියරින් (පුද්) සමාගම	-	2,549,144.14
ඇනලටිකල් ඉන්ස්ට්‍රුමන්ට්ස්	472,915.80	472,915.80
හේලීස් ලයින් සයන්ස් (පුද්) සමාගම	3,278,500.00	9,278,500.00
Anti-Doping Lab Qatar	7,631,250.00	-
	11,382,665.80	**12,300,559.94**

සටහන-12		
උපචිත වියදම්		
තැපල් සහ සන්නිවේදන	29,448.06	32,939.62
විදුලිය සහ ජල වියදම්	179,623.56	225,776.06
මෙහෙයුම් කල්බදු - ලීසිං කුලිය	-	216,000.00
වැටුප් හා වේතන	16,000.00	-
අතිකාල දීමනා වියදම්	57,757.62	63,561.33
ප්‍රවාහන වියදම්	90,000.00	88,000.00
ආරක්ෂක සේවා	266,328.20	192,014.00
පවිත්‍රතා සහ සනීපාරක්ෂක සේවා	178,000.00	150,050.00
විගණන ගාස්තු	263,600.00	-
තහනම් උත්තේජක පරීක්ෂණ වියදම්	119,547.62	69,458.48
ගොඩනැගිලි සහ සැලසුම් නඩත්තු වියදම්	-	33,480.00
යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්	-	156,756.60
ප්‍රකාශනය සහ ප්‍රවර්ධනය	11,550.00	-
	1,211,855.06	**1,228,036.09**

සටහන-13		
පාරිතෝෂික වෙන් කිරීම්		
වර්ෂය ආරම්භයේ වෙන් කිරීම	2,417,357.50	1,719,646.41
වසර සඳහා පාරිතෝෂික ගෙවීම	(299,675.00)	-
වර්ෂයේ වෙන් කිරීම	463,687.03	697,711.09
වර්ෂ අවසානයේ වෙන් කිරීම	**2,581,369.53**	**2,417,357.50**

සටහන-14	2022	2021
වෙනත් ආදායම්		
උත්තේජක පරීක්ෂණ ආදායම්	1,603,417.00	1,781,520.00
යලි නොගෙවන තැම්පතු	8,000.00	-
කුලී ආදායම්	78,750.00	67,500.00
වෙනත් ආදායම්	628,836.52	-
	2,319,003.52	**1,849,020.00**

සටහන-15		
පරිපාලන වියදම්		
වැටුප් හා වේතන	13,813,220.19	12,209,450.24
සභාපතිතුමාගේ දීමනා	-	450,000.00
අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	558,481.76	546,318.66
සේවක අර්ථසාධක අරමුදල	1,384,496.03	1,393,945.95
සේවක නියුක්තිකයේ භාරකාර අරමුදල	346,124.01	348,486.48
ගෘහස්ථ, ප්‍රවාහන සහ ඉන්ධන දීමනා	600,000.00	600,000.00
විදේශීය ගමන් වියදම්	454,948.80	-
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල උපකරණ	250,089.62	1,169,828.02
ඉන්ධන	2,280,751.50	963,950.00
වාහන නඩත්තු වියදම්	110,724.02	105,550.67
ගොඩනැගිලි සහ සැලසුම් නඩත්තු වියදම්	157,960.00	770,948.36
යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්	2,006,604.43	782,236.51
ප්‍රවාහන	1,129,937.00	1,066,840.00
මෙහෙයුම් කල්බදු සඳහා ගෙවීම්	2,401,000.00	2,592,000.00
තැපැල් සහ සන්නිවේදන	446,863.28	381,823.32
විදුලිය සහ ජලය	2,806,659.86	2,688,411.81
තහනම් උත්තේජක පරීක්ෂණ ගාස්තු	15,958,669.85	9,350,323.03
ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය	905,280.00	1,785,768.40
පුහුණු සහ රැස්වීම් වියදම්	877,883.09	996,275.14
සාමාජිකත්වය අළුත් කර ගැනීමේ වියදම්	5,625,034.46	2,869,043.03
විගණන ගාස්තු	384,200.00	-
අලෙවිකරණ සහ පර්යේෂණ වියදම්	116,380.27	110,000.00
දැනුවත් කිරීමේ වැඩමුළු	5,400.00	296,088.76
ධාරිතාව වර්ධන	352,309.00	79,240.00
ක්ෂය වීම්	32,926,436.17	17,511,392.06
පාරිතෝෂික වෙන් කිරීම්	463,687.03	697,711.09
පවිත්‍රතා සහ සනීපාරක්ෂක සේවා	2,016,937.50	1,537,598.76
ආරක්ෂක සේවා	2,613,567.90	2,247,913.00
අනෙකුත් වියදම්	80,744.44	-
තහනම් උත්තේජක සම්බන්ධ අධ්‍යාපනය	325,887.75	-
බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම	537,557.00	-
පර්යේෂණ හා සංවර්ධන	283,119.23	298,557.45
නීතිමය සහ බලාත්මක කිරීමේ වියදම්	557,872.00	321,333.00
පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදම්- ගොඩනැගිලි සහ සැලසුම්	-	263,304.00
පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදම්- යන්ත්‍රෝපකරණ	683,317.90	-
පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදම්- වාහන	28,500.00	793,172.02
	93,490,644.09	**65,227,509.76**

මගේ අංකය / எனது இல. / My No. SYA/C/SLADA/06/22/06 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023 මැයි 19 දින

සභාපති

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමෙදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 30 වගන්තිය සහ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 ඡේදය ප්‍රකාරව දේපල පිරියන හා උපකරණ ප්‍රයෝජනයට ගැනීමට සුදුසු වූ දිනයේ සිට ක්ෂය ප්‍රතිපාදන සැලසිය යුතු වුවද, නියෝජ්‍යායතනය විසින් ප්‍රමිතියේ නියමයන්ට පටහැනිව මුලු වර්ෂයටම ක්ෂය ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් රු. මිලියන 15.2 ක් වූ ක්ෂය වැඩිපුර දක්වා තිබුණු අතර එම වටිනාකමෙන් දේපළ පිරියත හා උපකරණ අගයද අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 08 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 12 ක් ඇතුලත ගෙවා නිම කිරීමට අදහස් නොකරන ශේෂයන් ජංගම නොවන වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වුවද, 2023 වර්ෂයේදී ගෙවිය යුතු පාරිතෝෂික අගය හඳුනා නොගෙන 2022 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද රු. මිලියන 2.6 ක් වූ මුළු වටිනාකමම ජංගම වගකීම් ලෙස දක්වා තිබුණි.

(ඇ) 2022 දෙසැම්බර් 31 දින වනවිට උත්තේජක මර්දන පරීක්ෂණ වාර්තා වෙනුවෙන් විදේශීය ආයතනයකට ගෙවිය යුතු රු. මිලියන 4.8 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන නියෝජ්‍යායතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අතුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

නියෝජ්‍යායතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් නිබෙ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජ්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය නියෝජ්‍යායතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් තැබීම හා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජ්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජ්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වීය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම් හෙළිදරව්කිරීම්

ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා නියෝජ්‍යායතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට නියෝජ්‍යායතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 **වෙනත් කරුණු**

(අ) ශ්‍රී ලංකාවේ සිදු කරන උත්තේජක පරීක්ෂාවෙන් ජාත්‍යන්තර මට්ටමින් පවත්වා ගැනීම මෙන්ම දේශීය ආයුර්වේද ඖෂධ හා ආහාරපාන වල අන්තර්ගතය හා ඒවායේ නහනම් ද්‍රව්‍ය අඩංගු වීය හැකිද යන්න සොයා බැලීම අරමුණු කොට නියෝජ්‍යායතනයේ පරීක්ෂණ ඒකකය සඳහා 2022 සැප්තැම්බර් 13 දින රු. මිලියන 60 ක් වූ පරීක්ෂණ යන්ත්‍රයක් වසර 03 ක වගකීම් කාලයකට යටත්ව ආයතනය වෙත බාර දී නිබුණි. මෙහෙයුම් කටයුතු සඳහා වන පරීක්ෂණාගාර සහයක තනතුරට බඳවා නොගැනීම සහ යන්ත්‍ර ක්‍රියාකාරිත්වයට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ඇනවුම් කිරීම ප්‍රමාද වීම නිසා 2023 මාර්තු 30 දින වන විටද මෙම යන්ත්‍රය උපයෝජනය කර නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 7.6 ක ගෙවිය යුතු ශේෂය තුල මාස 06 ඉක්මවූ රු. මිලියන 4.2 ක ශේෂයක් පැවතුණි.

(ඇ) නියෝජ්‍යායතනයේ පැවති කාර්ය මණ්ඩල පුරප්පාඩු 10 අතුරින් තනතුරු 03 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු වන අතර මෙයින් අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ) හා අධ්‍යක්ෂ (බලාත්මක කිරීම් හා ක්‍රියාත්මක කිරීම්) යන තනතුරු දෙක 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි.

ඩබ්ලිව්.ඒ.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විගණන වාර්තාව 2022 සහ කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

01 කරුණ - ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ ප්‍රයෝජනයට ගැනීමට සුදුසු වූ දිනයේ සිට ක්ෂය ප්‍රතිපාදන සැලසිය යුතු වුවද, නියෝජ්‍යායතනය විසින් ප්‍රමිතියේ නියමයන්ට පටහැනිව මුලු වර්ෂයටම ක්ෂය ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් රු.මිලියන 15.2 ක් වූ ක්ෂය වැඩිපුර දක්වා තිබුණ අතර එම වටිනාකමෙන් දේපළ පිරියත හා උපකරණ අගයද අඩුවෙන් දක්වා තිබුණි.

කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම -

ශ්‍රී.ල.රා.ගි.ප්‍ර. අංක 08 හි 69 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් භාවිතයට ගැනීමට සුදුසු වූ දිනයේ සිට ක්ෂය ගණනය කලයුතුව තිබුනද 2022 වසරේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුව අත්පත් කරගත් ජංගම නොවන වත්කම් එම සම්පූර්ණ වසර සඳහා ක්ෂය කිරීම් සිදුකර ඇත. LC-MS/MS යන්ත්‍රයේ වටිනාකම කෙරීගෙන යන වැඩ (Capital Work in progress) ගිණුමෙන් ජංගම නොවන වත්කම් යටතේ පර්යේෂණ උපකරණ යටතට මාරු කිරීම 2022.12.31 දින සිදු කල හෙයින් ජංගම නොවන වත්කම් ක්ෂය රු. 15,155,524 කින් වැඩිපුර ගණනය වීමක් සිදුව ඇත. ශ්‍රී.ල.රා.ගි.ප්‍ර. අංක 08 අනුව ක්ෂය ප්‍රතිපත්තිය සකස් කිරීම 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවද දන්වා සිටිමි.

එමෙන්ම වාර්ෂික ක්ෂය ඒ අදාල වර්ෂයේ භාණ්ඩාගාර හා අමාත්‍යාංශ ප්‍රතිපාදන වලින් කපා හැරීම හේතුවෙන් ආයතනයේ ලාභයට ඉන් කිසිදු බලපෑමක් සිදුවී නොමැති බවද දන්වා සිටිමි.

02 කරුණ - ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 01 හි 08 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 12 ක් ඇතුලත ගෙවා නිම කිරීමට අදහස් නොකරන ශේෂයන් ජංගම නොවන වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වුවද,2023 වර්ෂයේදී ගෙවිය යුතු පාරිතෝෂික අගය හඳුනා නොගෙන 2022 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද රු. මිලියන 2.6 ක් වූ මුළු වටිනාකම ජංගම වගකීම් ලෙස දක්වා තිබුණි.

කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම -

2022 වර්ෂ අවසානයේ පාරිතෝෂිත වෙන්කිරීම වන රු. 2,581,369 ක ශේෂය ජංගම වගකීමක් ලෙස පෙන්වා ඇත. ශ්‍රී.ල.රා.ගි.ප්‍ර. අනුව පාරිතෝෂිත වෙන්කිරීම් ගණනයේදි ඉදිරි වසරේ සේවය අවසන් කිරීමට අපේක්ෂිත සේවකයින් පිලිබඳ හඳුනා ගැනීමක් සිදු කර, ගිණුම් වර්ෂය අවසන් වී මාස 12 ක් ඇතුලත ගෙවා නිම කිරීමට අදහස් නොකරන ශේෂයන් ජංගම නොවන වගකීමක් ලෙස හඳුනාගෙන 2023 වසරේ සිට මූල්‍ය ප්‍රකාශ වල නිවැරදිව දැක්වීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

03 කරුණ - 2022 දෙසැම්බර් 31 දින වන විට උත්තේජක මර්දන පරීක්ෂණ වාර්තා වෙනුවෙන් විදේශීය ආයතනයකට ගෙවිය යුතු රු.මිලියන 4.8 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම -

රසායනාගාර ගෙවීම් සඳහා USD 7,700 හා USD 5,215 ක මුදල් ගෙවීම් 2022 දෙසැම්බර් මස 30 දින වවුචර් පත් 2ක් මඟින් සිදු කල අතර, ඒ සඳහා බැංකුව විසින් එම ගෙවීම් 2023.03.30 දින සිදු කරන ලදී. එමෙන්ම 2022 වසරේ අප රට මුහුණදී තිබූ දැඩි ආර්ථික අර්බුදය සහ විදේශ සංචිත වල හිඟය හමුවේ 2022 රසායනාගාර ගෙවීම් සඳහා ඇ.ඩොලර් නිදහස් කිරීම අපගේ ජංගම ගිණුම් පවත්වා ගෙන යන ලංකා බැංකුව විසින් පමා කිරීම මෙම ගෙවීම් ප්‍රමාදයට මූලිකවම හේතු විය.
මේ හේතුවෙන් 2022 වසරේ ණයහිමි හා මුදල් ශේෂය රු.මි. 4.8 ක් අඩුවෙන් දක්වා තිබිණ. 2023 වර්ෂයේ සිට එවැනි දුර්වලතා මඟ හරවා ගෙන කටයුතු කරන බව දන්වමි.

04 කරුණ - ශ්‍රී ලංකාවේ සිදු කරන උත්තේජක පරීක්ෂාවෙන් ජාත්‍යාන්තර මට්ටමින් පවත්වා ගැනීම මෙන්ම දේශීය ආයුර්වේද හා ආහාර පාන වල අන්තර්ගතය හා ඒවායේ තහනම් ද්‍රව්‍ය අඩංගු විය හැකිද යන්න සොයා බැලීම අරමුණු කොට නියෝජ්‍යායතනයේ පර්යේෂණ ඒකකය සඳහා 2022 සැප්තැම්බර් 13 දින රු. මිලියන 60ක් වූ පරීක්ෂණ යන්ත්‍රයක් වසර 03 ක වගකීම් කාලයකට යටත්ව ආයතනය වෙත බාර දී තිබුණි. මෙහෙයුම් කටයුතු සඳහා වන පරීක්ෂණාගාර සහයක තනතුරට බඳවා නොගැනීම සහ යන්ත්‍ර ක්‍රියාකාරීත්වයට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ඇනවුම් කිරීම ප්‍රමාද වීම නිසා 2023 මාර්තු 30 දින වන විටද මෙම යන්ත්‍රය උපයෝජනය කර නොතිබුණි.

කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම -

ප්‍රමාදව පැවති LC-MS/MS උපකරණයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2022.11.04 දින ලිපියෙන් පසු සාර්ථකව අවසන් කර වසර 3 ක වගකීම් කාලය 2022.11.04 දින සිට ආරම්භ කරන ලදී.

තාක්ෂණ සහකාර (පර්යේෂණාගාර) තනතුර 2021.06.16 දින අනුමත වූ අතර එහි බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වූයේ 2022.01.13 දිනයි. එම තනතුර ඉතා අත්‍යාවශ්‍ය තනතුරක් වූ නමුත් පසුගිය කාලය පුරා පවතින රජයේ සියලු බඳවා ගැනීම් අත් හිටුවා තිබීම හේතුවෙන් මෙම තනතුරෙහි බඳවා ගැනීම් කළ නොහැකි විය. මේ තනතුර සඳහා බඳවා ගැනීමට අවසරය ඉල්ලමින් අප විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉල්ලීමක්ද යොමු කෙරිණි.මේ වන විට එම රජයේ සියලු බඳවා ගැනීම් සමාලෝචනය කර අනුමැතිය ලබා දෙන ලෙස අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පත්කර ඇති කමිටුව වෙතද උක්ත ඉල්ලීම කර තිබේ. එහි අනුමැතිය ලද වහාම බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතයි.

ඉදිරියේ සැලසුම් කර ඇති පර්යේෂණ සඳහා ඇණවුම් කල රසායනික ද්‍රව්‍ය ලැබීමේ ප්‍රමාදයක් සිදුව තිබේ. ශ්‍රී ලංකාවේ උද්ගතව තිබූ විදේශ මුදල් සීමාවීම් නිසා රට තුල අත්‍යාවශ්‍ය රසායන ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක හිඟයක් පවතී. මෙම තත්වය ක්‍රමිකව නිවැරදි වූ විට අදාල ද්‍රව්‍ය ලබා ගැනීමට හැකියාවක් ඇත.තිබෙන රසායනික ද්‍රව්‍ය භාවිතා කරමින් දැනට පර්යේෂණ කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.

05 කරුණ - 2022 දෙසැම්බර් 31 දිනට පැවති රු. මිලියන 7.6 ක ගෙවිය යුතු ශේෂය තුල මාස 06 ඉක්මවූ රු.මිලියන 4.2 ක ශේෂයක් පැවතුණි.

කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම -

2022 වසර මුල භාගයේ සිට **Anti- Doping Lab Qatar** හි රසායනාගාර ගෙවීම් සඳහා ලංකා බැංකුව වෙත ඉදිරිපත් කරන ලද Telegraphic Transfer Orders රටෙහි පවත්නා විදේශ සංචිත

වල භිඟය හේතුවෙන් එම බැංකුව විසින් භාර ගැනීම තාවකාලිකව නවතා ඇති බව පවසා භාරගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. දිගින් දිගටම ඇ.ඩොලර් නිදහස් කිරීම සිදු නොකරන ලද නිසා **Anti- Doping Lab Qatar** ආයතනය ලිඛිතව දැනුවත් කර අදාළ ගෙවීම් සිදුකිරීමට වසරක සහන කාලයක් ඔවුන්ගෙන් ලබා ගන්නා ලදී. නැවතත් බැංකුව මගින් ඩොලර් ගෙවීම් 2023 වසරේ මාර්තු මස සිට සිදු කිරීමට කටයුතු කර ඇති අතර භාණ්ඩාගාරයෙන් මුදල් නිදහස් වූ වහාම එම ගෙවිය යුතු ශේෂයන් ගෙවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. 2023 වර්ෂයේ සිට එවැනි දුර්වලතා මඟ හරවා ගෙන කටයුතු කරන බව දන්වමි.

06 කරුණ - නියෝජ්‍යායතනයේ පැවති කාර්ය මණ්ඩල පුරප්පාඩු 10 අතුරින් තනතුරු 03 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු වන අතර මෙයින් අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ) හා අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම) යන තනතුරු දෙක 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි.

කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම -

අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ) තනතුරට බඳවාගැනීම සඳහා 2019 වර්ෂයේ අයඳුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසු අයකු තෝරාගන්නා ලදි. එම නිලධාරිනිය ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ වෛද්‍ය නිලධාරිනියක් ලෙස සේවය කල අතර, ඇය විසින් එවකට සිටි විශ්‍රාම වැටුප් සහිත තනතුරෙන් ඉවත්ව පූර්ණ කාලීනව අප ආයතනයේ උක්ත තනතුර සඳහා සේවය කිරීමට ඉදිරිපත් නොවුණි. නමුත් ඇය 2023 වසර දක්වා උක්ත තනතුරේ වැඩ බැලීමේ පදනම මත අප ආයතනයේ සේවයේ යෙදුණි. නමුත් මේ වන විට (2023.04.03 වන දින විට) ඇය මෙම තනතුරෙන් ඉවත්ව සිටින අතර එම පුරප්පාඩුව නැවත බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතුව පත්කොට ඇති රජයේ සියලු බඳවා ගැනීම් සමාලෝචනය කිරීමේ කමිටුව වෙත එම ඉල්ලීම ඉදිරිපත් කර තිබේ. එම අනුමැතිය ලද වහාම බඳවා ගැනීම කඩිනමින් සිදුකිරීමට නියමිත වේ.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යාතනයේ තවත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරක් වන අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම) තනතුර, ආයතනයේ බිහිවූ 2014 වසරේ සිට අවස්ථා ගණනාවකදී බඳවා ගැනීමේ පරිපාටි ප්‍රකාරව බඳවා ගැනීමට උත්සහ කළද ඒ සඳහා හැකියාවන්ගෙන් යුත් සුදුසු අයඳුම්කරුවකු ඉදිරිපත් නොවුණි. මේ හේතුවෙන් එහි බඳවා ගැනීමේ පරිපාටියද සංශෝධනය කරන ලදි. ඉන් අනතුරුව ද ආයතනය අපේක්ෂා කරන හැකියාවෙන් පරිපූර්ණ අයෙකු අයඳුම්කර නොතිබුණි. මේ සඳහා අවශ්‍ය වනුයේ මත්ද්‍රව්‍යනාශක යන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අත්දැකීම් සහිත ජ්‍යෙෂ්ඨ මට්ටමේ පොලිස් හෝ ආරක්ෂක අංශයේ නිලධාරියෙකි. දිගින් දිගටම මෙම තනතුර පුරප්පාඩුව පැවතීම හේතුවෙන් ද්විතියන පදනම මත හෝ එවැනි පොලිස් හෝ ආරක්ෂක අංශ නිලධාරියකු බඳවා ගැනීමට එම ආයතනය වෙත ඉල්ලීම් ඉදිරිපත් කරන ලදි. නමුත් ද්විතියන පදනම මත එවැනි නිලධාරියකු අප ආයතනයට පූර්ණ කාලීනව ලබා දිය නොහැකි බවත් වැඩ බලීමේ පදනම මත පමණක් ලබාදිය හැකි බවත් දන්වා සිට ඇත. එබැවින් මෙම අත්‍යාවශ්‍ය පුරප්පාඩුව සඳහා වැඩ බැලීමේ පදනම මත ශ්‍රී ලංකා පොලිස් සේවයේ වැඩ බලන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වරයෙකු 2023.02.28 දින සිට පත්කර ගන්නා ලදි.